# ඕලන්දෙන් කසාවතට



# ඕලන්දේ
# ආනන්දාපදානය

## කර්තෘගේ වෙනත් කෘති

සේවක සම්පත

නායකත්වය

කාලයෙන් වැඩ ගැන්මේ කලාව

සභාවෙන් අවසරයි

පාරිභෝගික සත්කාරය

ඊකියාවයි ඔබයි

රක්ෂණ උපදේශකවරයානෙනි

සතියෙන් දවසක්

දෙවියන් දිවිමන් බුදුන් උපන් රට (සංචාරක සටහන්)

කවුරුද ඔබෙ යහළුවෝ (ළමා පොතක්)

සමත්විය යුතු පහ (ළමා පොතක්)

Switching off

Inward bound

ජාතික විදසුන

උඩු ගං බලා

සිහියෙන් සිටීම

Living Together

# ඕලන්දේ ආනන්දපදනය


දීපාල් සූරියආරච්චි

පරිවර්තනය ඩී.සී. රණතුංග



සරසවි ප්‍රකාශකයෝ

30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයන්ගේ නිසි අවසරයකින් තොරව මෙම ග්‍රන්ථය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ උපුටා ගැනීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික් ආදී කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම, බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

**ඕලන්දේ ආනන්පදනය**

පළමු මුද්‍රණය 2019

**© දීපාල් සූරියආරච්චි**

ISBN 978-955-31-

පරිගණක පිටු සැකසුම
සී/ස සරසවි ප්‍රකාශකයෝ

පිටකවරය නිර්මාණය
සී/ස සරසවි ප්‍රකාශකයෝ

මුද්‍රණය
සී/ස සරසවි ප්‍රකාශකයෝ
601, අතුරුගිරිය පාර,
මාලබේ.

ප්‍රකාශනය
සී/ස සරසවි ප්‍රකාශකයෝ
23, ඒකනායක මාවත,
නුගේගොඩ.

www.sarasavi.lk

# පිදුම





ළදරු වූ යම්කිසි භික්ෂුවක්
බුද්ධානුශාසනයෙහි හොඳින් යෙදේ නම්
ඒ භික්ෂු තෙම වලා පටලෙන් නිකුත්
පුන්සඳ මෙන් ඒකාන්තයෙන් ම
මෙලොව බබලවයි

භික්ෂු වර්ගීය - ධම්මපදය

# ඉන්දියාවට එන්න ආසාව

දිනය 1972 දෙසැම්බර් 4. මගේ අනාගත ජීවිතයට ගැලපෙන මාවතක් සොයා මම ඉන්දියාව බලා පිටත්වුණු දිනය. මගේ පියාගේ උපන් දින සාදයත් යෙදී තිබුණේ එදාටම යි.

ඊට හය අවුරුද්දකට කලින් ඕලන්දේ අගනුවර වන ඇම්ස්ටර්ඩෑම් නගරයේ විශ්ව විද්‍යාලයට ඇතුල්වූ දා පටන් මම හිටියේ ගෙදරින් පිටත. ඒ වයසේ ඕනෑම තරුණයෙක් තමන්ගේ ගෙදරින් පිටවෙලා තමාගේම ජීවිතයක් ගෙනයෑම සාමාන්‍ය දෙයක්. ඕලන්දය ඇලවල් වලට ප්‍රසිද්ධ රටක්. බොහෝදෙනා ඒවායේ 'පාවෙන ගෙවල්' වල පදිංචිවී සිටිනවා. ඒවාට කියන්නේ 'බෝට්ටු ගෙවල්' මමත් ඒ ගෙයකයි පදිංචිවුනේ.

මම මූලික උපාධියට සමාජ විද්‍යාව ඉගෙන ගනිද්දී සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකය ගැන හැදෑරූ නිසා මට ඒ රටවල් ගැන ඉබේම උනන්දුවක් ඇතිවුණා. මා 'එම් ඒ' උපාධිය සඳහා අධ්‍යයනයේ යෙදුනත් අවසාන කාලයේ දී තිබුණ විෂයයන් ගැන උදාසීන බවක් ඇතිවුණා.

ලෝකය සාධාරණත්වයෙන් තොර බවත් එය වැරදි දිශාවකට යොමු වී ඇති බවත් මට හැඟී ගියා. එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියට (UNDP) බැඳුණොත් දුප්පතුන් හා පොහොසතුන් අතර පරතරය අඩුකිරීමට පුලුවන්වෙයි කියා මම කල්පනා කළා. එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනටමත් ඕලන්ද ජාතිකයන්ගෙන් පිරී ඇති බව ඒ අය මට කීවා. ඊළඟට කළයුත්තේ කුමක්දැයි මට හිතාගන්න බැරිවුණා.

ලෝකය ගැන අසහනකාරී හැඟීමක් එක්ක දේශපාලනය ගැනත් මම හිටියේ ලොකු උනන්දුවකින්. මේ නිසා මම අමෙරිකාවේ නිව්යෝක් ප්‍රාන්තයේ ඉත්කා නුවර කෝනෙල් සරසවියේ ගිම්හානයේ පැවැත්වෙන පාඨමාලාවක් හැදෑරීමට 1968 දී පිටත්ව ගියා. කලකෝලාහල වලට ප්‍රසිද්ධ චිකාගෝ වේ ජෙසී ජැක්සන් වගේ අය දුප්පතුන්ගේ ව්‍යාපාරයක් පටන්ගත්තා. මමත් ඒ අයගේ ප්‍රජාතන්ත්‍රවාදී සංගමයට

බැඳුණා. රිචඩ් නික්සන් ජනාධිපති වුනාම මම එයින් ඉවත්වුණා. දේශපාලන කටයුතු වලට ආයුබෝවන් කීවා.

මා ගැනත් ලෝකය ගැනත් මගේ අසන්තෝෂය වැඩිවීමට පටන් ගත්තා. ඒ ගැන යමක් කරන්නට ඕනෑ කියා මට හැඟී ගියා.

සුප්‍රකට බීටල්ස් ගායක කණ්ඩායම 'ට්‍රාන්සෙන්ඩෙන්ටල් භාවනාව' පුරුදු කිරීමට පටන්ගත්තේ ඒ කාලයේදී. මමත් ඒ භාවනාව පටන්ගත්තා. ඒ අතර ස්වාමි පරමහංස යෝගානන්ද ගේ 'යෝගීවරයෙකුගේ චරිතාපදානය' 'Auto biography of a yogi' නම් පොත ඕලන්දයේදී සංගීත විද්‍යාව හැදෑරූ මගේ ඇමෙරිකන් මිත්‍රයෙක් මට තෑගි කළාග ඒ පොත කියැවීමෙන් පස්සේ මට ඉන්දියාවට යන්න ආසාවක් ඇතිවුණා.

## අමුත්තෙක් පැමිණේ

ඉන්දියාවට යන්න ලකලෑස්ති වෙද්දී දිනක් අහම්බෙන් එක්තරා ඉන්දියානුවෙක් මගේ බෝට්ටු ගෙදරට ආවා. මගේ මිත්‍ර ඇමෙරිකන් යුවලක් මා බලන්න එද්දී පාර අයිනේ සිටි කෙනෙක් වාහනය නතර කර තිබෙනවා. ඔහු ඩෙන්මාර්කයේ සිට ඕලන්දයට යන බව කී නිසා වාහනයට නංවාගෙන ආවා.

අමුත්තා ජර්මනියේ ෆ්‍රෑන්ක්ෆර්ට් නුවර ජාත්‍යන්තර පොත් සල්පිලට ඇවිත් ඉන්පසු සංචාරයක යෙදෙමින් සිටි අයෙක්. උගත් බ්‍රාහ්මණයෙකු වූ ඔහුගේ නම ප්‍රභූ නාරායන් ෂර්මා. ඔහු බිහාරයේ 'රාන්චි' ප්‍රදේශයේ ඉපදුණු කෙනෙක්. ඔහු මට හමුවූ ප්‍රථම ඉන්දියානුවා.

මේසය උඩ තිබුණු යෝගානන්දගේ පොත දැකපු ඔහු යෝග ගැන මගේ උනන්දුව ගැන ඇහුවාම මම ඉන්දියාවට යන්න ලෑස්ති වන බව කීවා. දිල්ලි නගරයට ගුවන් ගමන් ටිකට් පතක් ද ඒ වන විට මගේ සාක්කුවේ. ඔහුගේ පවුල යෝගානන්ද ආශ්‍රමය සමීපයේ ජීවත් වන බව කියා මා ඉන්දියාවට පැමිණුනාම ඔහුගේ ගෙදර නැවතී සිටීමට පැමිණෙන ලෙස මට ආරාධනා කළා.

අහම්බෙන් ලැබුණු ආරාධනය ඉන්දියානු සමාජය, සංස්කෘතිය හා ආගම ගැන දැනගැනීමට පෑදුණු හොඳම මාර්ගය වුණා. පොහොසත් උගත් බ්‍රාහ්මණ පවුලක් සමග මාස ගණනක් ජීවත් වීමට ලැබීම මා ලැබූ මහඟු අවස්ථාවක්. උතුරේ හිමාලයේ සිට දකුණේ කන්‍යා කුමාරි දක්වා මගේ සෙවිල්ල අරඹන තෙක් දෙමසක කාලයක් මම ඔවුන් සමග හිටියා.

# ළමා වියෙන් තරුණ වියට



මා උපන්නේ 1948 ජනවාරි 2 වනදා ඇම්ස්ටර්ඩෑම්හි ෆොන්ඩල්පාක් (Vondelpark) නමැති පෙදෙසේ. ඒ දෙවන මහා ලෝක යුද්ධය හමාරවී වසර තුනකට පසුව යි. මගේ පියා යුදෙව් ජාතිකයෙක්. මව ක්‍රිස්තියානි ආගම වැළඳගෙන සිටි කාන්තාවක්. විවාහ වූවාට ඔවුන් කිසිම ආගමක් ඇදහූ බවක් මට මතක නැතත් දෙදෙනා මානව හිතවාදීන් හැටියට නිදහස් අදහස් ප්‍රකාශ කරන සමාජයීය සංවිධානයක් සමග කටයුතු කළා. මගේ වැඩිමල් සොහොයුරා වූ හැන්ස් උපන්නේ 1945 අප්‍රියෙල් 27 වන දා ජර්මානු ආක්‍රමනිකයන්ගෙන් රට මුදාගෙන හරියටම සතියකට පසුව. සුප්‍රකට රයික්ස් කෞතුකාගාරය තිබුණේ අප පදිංචිවී සිටි ෆොන්ඩල්පාක් උද්‍යානයට කිට්ටුවෙන්.

මගේ සීයා යුදෙව්වෙකු වූ නිසා ඔහුගේ කණ්ණාඩි සාප්පුව ඔහුට අහිමි වූවා. සීයාගෙන් පසු එය අයිති වූයේ ජර්මානුවන් හා එක්ව කටයුතු කළ ලන්දේසි

හවුල්කරුවෙකුට. ජර්මානුවන් විසින් මගේ පියාගේ සොහොයුරා පැහැර ගෙනයන ලැබුවත් ඔහු ජර්මානුව නිලධාරීන්ගේ ඡායාරූප ගැනීමේ යෙදී සිටි නිසා ඔහුගේ ජීවිතය බේරුණා. ඔහුගේ බිරිය සොන්යා ඉතාමත් දරුණු වධකාගාරය වූ **ඖෂ්විච්** (Auschwitz) වෙත ගෙන යනු ලැබුවා. යුද්ධය අවසානයේ ජීවිතය බේරාගත් 125 දෙනාගෙන් ඇය එක් අයෙකු වූවා.

මගේ පියා රන් අබරණ සාදන්නෙකු වශයෙන් ජීවිතය අරඹා වැඩි කල් නොගොස් ජර්මනියෙන්, ප්‍රංශයෙන් හා වෙනත් රටවලින් රිදී සහ පලිඟු ආනයනය කර විකිණීමට පටන් ගත්තා.

ටික කලකින් අපි කුඩා නගරයක පදිංචියට ගිහින් අවුරුදු පහක් එහි ගත කළා. ප්‍රාථමික පාසලට ගිය මම පියානෝ වාදනයත් ඉගෙන ගත්තා. දවසක් මගේ කුඩා බයිසිකලය කාර් එකක හැපී මම දරුණු අනතුරකට මුහුණපෑවා මට මතකයි.

එළදෙනුන්, තණ බිම් හා පටු අදහස් ඇති මිනිසුන් අතර මා කල්ගතකළේ වැඩි සතුටකින් නොවේ.

1955 දී අපි පදිංචියට ගිය උද්‍යාන නගරයක් වූ හිල්වර්සම් (Hilversum) නගරයේ තමයි නෙදර්ලන්තයේ සියළුම රේඩියෝ සහ රූපවාහිනී ආයතන තිබුණේ. අපි එහි සිටියේ හොඳට ඉඩකඩ ඇති විශාල ගෙයක. එය වාසනාවන්ත ගෙයක් බව අපට දැනුණා. පියාගේ ව්‍යාපාර කටයුතු දියුණු වූ නිසා මා ද මගේ පියා සමග එක්වී කටයුතු කිරීමට සිතුවා. මගේ සහෝදරයා වෙළඳ මුහුදු සේවයක පළමු නිලධාරි බවට පත්වීමෙන් පසු විවාහ වූවා.

මම සංගීත පාඩම් තවදුරටත් කරගෙන යද්දී හොරණෑ වාදකයෙකු හැටියට පාසලේ වාදක කණ්ඩායමට බැඳුණා. ශීත ඍතුවේදී අපි ඇල්ප්ස් කඳුවල හිමෙහි කඳු මුදුනේ සිට පාමුල දක්වා වේගයෙන් එන 'ස්කීං' (Skiing) ක්‍රීඩාවේ යෙදුණා. ග්‍රීෂ්ම ඍතුවේදී ඉතාලිය, ස්පාඤ්ඤය, ප්‍රංශය සහ ඔස්ට්‍රියාව වැනි රටවලට ගිහින් නිවාඩු කාලය ගතකළා. ටෙනිස් හා ගොල්ෆ් ගැසීම, ඔරු පැදීම, වන පෙදෙස් වල සැරිසැරීම තමයි මගේ විනෝදාංශයන් වුණේ. ඒ අතර වසර තුනක් 'බෝල්රූම්' නැටුම්ද ඉගෙන ගත්තා. ඒ නෙදර්ලන්ත රාජකීය පවුල සිය දරුවන් එවූ න් **කාලින්ගන්** (Van Karlingen) නම් සුප්‍රසිද්ධ නැටුම් ගුරුවරයා ගෙන්. පාසල් රේඩියෝ වැඩසටහන්වලටත් තරුණ නිවේදක වැඩසටහන්වලටත් මම සහභාගී වුණා.



හිල්වර්සම්හි පාසලේ උසස් අධ්‍යාපනය හමාර කර 17 වන වියේදී මම සිසුන් හුවමාරු වැඩ සටහනක් යටතේ අමෙරිකාවේ මිචිගන් නුවර පිහිටි 'යුත් ෆෝ අන්ඩර්ස්ටෑන්ඩිං' (Youth for Understanding) නමැති තරුණයින් වෙනුවෙන් පැවැත්වුණු අධ්‍යාපන අයතනයක වසරක් ගතකළා. එහිදී ඉගෙනුමට බාහිරව සංගීත කණ්ඩායම, තූර්ය වාදක කණ්ඩායම, පුවත්පත් සංසදය ට එක්වූවා.

මගේ ඉංග්‍රීසි ගුරුවරිය මා දිරිමත් කළ නිසා විශ්ව විද්‍යාලයට ඇතුල්වී නම් දැරූ මහාචාර්යවරුන් කීපදෙනෙකු යටතේ වසර හයක් ආර්ථික විද්‍යාව හා ආර්ථික සමාජ විද්‍යාව හැදෑරුවා.

# ඉන්දියාවේ ආශ්‍රම සොයමින්

අහම්බෙන් ප්‍රභූ නාරායන් ෂර්මා හමුවීම ඉන්දියාවේ මගේ සංචාරයට මහත් පහසුවක් වුණා. ඒ ගෙදර නැවතී මම යෝගානන්ද ස්වාමිගේ ආශ්‍රමයට යන්න පටන්ගත්තා. එහිදී මා බලාපොරොත්තු නොවූ කෙනෙකු හමුවුණා. ඒ ස්වාමි යෝගානන්දගේ ප්‍රධාන සිසුවියක් වූ දයා මාතාව. කැලිෆෝනියාවේ Self Realisation සංගමයේ සභාපතිනිය වූ ඇය ස්වාමි යෝගානන්දගේ මරණින් පසු ආශ්‍රමයේ ප්‍රධානියා වූවා.

මල් මල් කමිසයක් හා නිල් පැහැති කලිසමක් ඇඳ සිටි මා ආශ්‍රමයේදී දුටු දයා මාතාව "ඔබ කොයි රටින්දැ" යි මගෙන් ඇසුවා. "ඇම්ස්ටර්ඩෑම්" වලින් යයි මා උත්තර දුන්නා. එවිට ඇය "කදිමයි" කීවා. දෙවන දවසේත් මා හමුවුනාම 'ඔබ කොයි රටෙන්ද" යි ඇය මගෙන් ඇසුවා. "ඇම්ස්ටර්ඩෑම් වලින්" කීවාම කලින් දා මෙන්ම ඇය "ආ! කදිමයි" කීවා.

ආශ්‍රමයේ නැවතීමට පුළුවන් දැයි මා ඇගෙන් ඇසුවාම "ආශ්‍රමය තියෙන්නෙ ඉන්දියානුවන්ට විතරයි" කියා ඇය කීවා. ඕලන්දයේ ශාඛාවක් තිබෙන නිසා තැපැල් මගින් පාඨමාලාවක් හදාරා ඊට පසු කොටස් හයකින් යුත් 'ක්‍රියා යෝග' වැඩසටහනට ඇතුලවන්න පුලුවනැයි ඇය කීවා. මෙසේ දයා මාතා මගේ හිත නොරිද්දවා මා ආශ්‍රමයට ඇතුල්වීම ප්‍රතික්ෂේප කළා. ඒ නිසා ආශ්‍රමයක් සොයා මම ඉන්දියාව පුරා යෑමට පටන්ගත්තා. මා ආශ්‍රමයක් සෙවීම පටන් ගත්තේ ඍෂිකේෂ් හි ශිවානන්ද ආශ්‍රමයෙන් එහි සභාපති ස්වාමි චිදානන්ද ගෙන් යම් තරමක යෝග ඉගෙන ගැනීමටත් භගවත් ගීත ගැන දේශන කීපයක් ඇසීමටත් මට එහිදී අවස්ථාව ලැබුණා.

# බරණැසදී

කුමන හේතුවක් නිසා හෝ මට බුද්ධාගම වඩාත් සුදුසු කියා ෂර්මා පවුල කීවා. බෞද්ධ සිද්ධස්ථාන කීපයක් දැකබලාගන්නැයි කියා සාරානාත් සමීපයේ බරණැස ඔවුන්ගේ නෑදෑයෙකු සිටින බවත් මට ඔහු සමග එහි නැවතීමට පුලුවන් බවත් ඒ අය කීවා. ඔවුන් කී දේ අසා මම එහි ගියාම ඔහු සාදරයෙන් මාව පිළිගත්තා. මුළු බරණැසටම දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා වූ ඔහු වැදගත් පුද්ගලයෙක් බව මට තේරුම් ගියා. මම එහි ළඟා වූ හැටියේම හිමිදිරි උදෑසන පිරිසිදුවීමට කියා ඔහු ගංගා නම් ගඟේ නෑමට මා කැඳවා ගෙන ගිය හැටි මට තවම මතකයි. එදා හොඳටම සීතල දවසක්. මගේ ඇඟ හිරිගඩු පිපුණා.

ඔහු ගඟට පැන දිය යට ගිලී ගංගා ජලයෙන් බිඳක් බොනවා මම බලාසිටියා. පසුවදා උදෑසන ගංගා නම් ගඟේ ජලයේ විෂබීජ නිසා බෝවෙන රෝග ගැන ලිපියක් පුවත් පතක පළවී තිබුණා. දිස්ත්‍රික් වෛද්‍යවරයා මේ සියල්ල දැන සිටින්නට ඇති. 'සිත අන් සියල්ල අභිබවනය කරනවා' යැයි කියමනක් තිබෙනවානේ! බයිසිකලයක් පැදගෙන යන ගමන් භාවනා කරන හැටි ඔහු මට ඉගැන්වූවා!

සාරානාත්හි මෙන්ම ඒ අවට ද සිද්ධස්ථාන බැලීමට ගිය විට මට ඒවා ගැන බලවත් පැහැදීමක් ඇතිවුණා. සාමකාමී වාතාවරණයක් දැනුණා පිරිසිදුවට තිබුණු සිද්ධස්ථාන වල ශාන්ත පරිසරයට මගේ සිත බෙහෙවින් ඇදී ගියා.

බරණැස සිටිද්දී දවසක් මම ගංගා නදියේ පඩියක් උඩ හිඳගෙන භගවත් ගීතාවේ පිටපතක් කියවමින් සිටියා. බ්‍රාහ්මණ ළමයෙක් මගෙ ළඟට ඇවිත් මගේ කරට උඩින් එබී බලා "අපේ පූජනීය පොත කියවන එක ගැන ඔබට ස්තුතියි" කියා කීවා. එයින් මා තුළ කොතරම් හොඳ හැඟීමක් ඇති වූයේද කීවොත් ගංගා නම් ගං තීරයේ මිය ගියත් කමක් නැතැයි මට සිතුණා.

බෞද්ධ පූජනීය ස්ථාන දැක බලාගෙන මම ආශ්‍රමයක් සෙවීමේ දුෂ්කර කටයුත්ත තවදුරටත් කරමින් හිමාල ප්‍රාන්තයේ **ඍෂිකේෂ්** සිට දකුණේ කන්‍යා කුමාරි (කොමරින් තුඩුව) දක්වා ඉන්දියාව පුරා සංචාරය කළා.

මධ්‍යම ඉන්දියාවේ නාග්පූර් ආසන්නයේ වර්ධාහි සේවා ආශ්‍රමයේදී මට ආචාර්ය විනෝබා භාවේ (1895-1982) මුණ ගැසුණා. මහත්මා ගාන්ධිගේ සමකාලීනයෙකු වූ ඔහු උසස් චින්තනයකින් හෙබි චාම් පුද්ගලයෙක්. "මුළු ලෝකය ගැන සිතා තම දේශයට ගැලපෙන ලෙස කටයුතු කරන්න" යයි ගාන්ධිගේ කියමනක් මට මතකයි.

විනෝබා භාවේ සිටියේ අයහපත් සෞඛ්‍ය තත්වයක ඔහු නිහඬව කාලය ගෙවූ නිසා මට ඔහු සමග කතාබස් කරන්න බැරිවුණත් යමක් ලියාදුන්නාම ඔහු කියවා බැලුවා. මා මහා කුම්භ මේලාව දැකීමට යායුතුදැයි මම ඔහුගෙන් ඇසුවා. **ප්‍රයාග්හිදී** මිලියන දොළහක පමණ ජනකායක් සහභාගී වන එය ඉතා උසස් පෙළේ අධ්‍යාත්මික උත්සවයක්. ගංගා, යමුනා සහ සරස්වතී ගංගාවන් ප්‍රයාග්හිදී එකට එක්වෙනවා. කුම්භ මේලා උත්සවය වසර තුනකට වරක් පැවැත්වුවත් එවර වසර 144 කින් පසු උත්කර්ශවත් ලෙසයි පැවැත්වුණේ. මේ වනවිට මා සිටියේ තදබල කැස්සකින් පීඩා විඳිමින් මගේ පාදයේද තුවාලයක් ද තිබුණු නිසා මේ ගමන යෑම ගැන මගේ සිතේ කුකුසක් වූ නිසයි මා විනෝබාගෙන් ඒ ගැන විමසුවේ. "ඔබට උවමනා නම් යන්න" කියා ඔහු කීවා.

# ආශ්‍රමයක් සෙවිල්ල දිගටම



ආචාර්යවරයෙකු සොයමින් මම ගෝවේ කනන්සාටිහි වෙරළබඩ මාසයක් ගත කළා. මෙහිදී ශිවානන්දන ආශ්‍රමයේ කලින් බ්‍රහ්මචාරීව සිටි තරුණයෙක් විදේශිකයන්ට නොමිලේ යෝග පාඨමාලා පැවැත්වූවා.

1973 පෙබරවාරි 21 වනදා මම පොන්ඩිචේරිහි **ශ්‍රී අරුබින්දෝ** ආශ්‍රමයට ගිය වේලේ 'ප්‍රංශ මාතාව' ආශ්‍රමයේ සඳලුතලයේ සිට අවසාන 'දර්ශනය' දක්වූවා. ඇය සඳලුතලයේ සිටියදී ඇය දෙස බලා සිටින දහස් සංඛ්‍යාත පිරිස අතර සුදු පැහැති යෝගී ඇඳුමක් ඇඳගත් මම ද සිටියා.

ඇගේ දෑස බෙහෙවින් විනිවිද පෙනෙනසුළු බව මට දැනුණා. ඇගේ දෑස මා වෙත යොමු වී තිබුණා. මට මගේ දෑස ඇය වෙතින් ඉවත් කරන්නට බැරිවුණා.

**අරුබින්දෝගේ** ධර්මය පැටලිලි සහිත බව දැනුණ නිසා මම එය අනුගමනය කිරීම නවතා දැම්මා. **අරුබින්දෝගේ** කිරිගරුඬ සමාධිය වැසී තිබුණු අලංකාර රෝස හා වෙනත් විවිධ වර්ගවල මල් වලටත් මාතාවටත් මා නමස්කාර කළා. මගේ හිතට එයින් සැහැල්ලුවක් දැනුණු බව මට මතක් වෙනවා.


තමිල්නාඩුවේ **තිරුවන්නමලේ රාමන** මහර්ෂිගේ ආශ්‍රමයේදී ඇතිවුණේ ඊට වෙනස් හැඟීමක්. **අද්වයිත වේදාන්තය** පැහැදිලි කළ **රාමන** ඇසුවේ එක ප්‍රශ්ණයයි - ඒ "මා කවුද" කියා. ඔහු තමාගේ ආශ්‍රමය පිටුපස කන්දේ ගුහාවෙහි භාවනා කළේ කුඩා රෙදි කඩකින් පමණක් විලි වසාගෙන. ඔහු තමාගෙන් ආශිර්වාද ලබා ගැනීමට එන ජනකාය සිනාවෙන් පිළිගත්තා.

මදුරාසියේ දකුණු දිග පිහිටි මහබලිපුරම්හිදී දමිළ චිත්‍රපටවලට සංගීතය නිර්මාණය කරන සුපකට කේ.වී. මහාදේවන්ගේ පුත්‍රයා ද වෙන්ගතගිරි මහාරාජාගේ මුණුපුරාද මට හමුවුණා. මේ දෙදෙනාම සත්‍ය සායි බාබාගේ ප්‍රබල අනුගාමිකයන්. ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්තයේ සිට ඇවිත් සිටි කීත් ජැෆ්රේ නමැත්තෙක් ද අපට එකතුවී හතරදෙනාම පෙබරවාරි මාසයේ අළුත් සඳ පායන මහා ශිවරාත්‍රි දවසේ සත්‍ය සායි බබා දැකීමට ගියා. අපි ගියේ හිමිදිරි පාන්දර. අප පුට්ටපර්ති වෙත ළඟා වනවිට බාබාගේ පාද නමස්කාර කරන්නැයි මගේ මිතුරෝ කියා සිටියා. ඔහුගේ දෙපා ස්පර්ශ කරන්න මා ඇඳ සිටි සුදු පැහැති ඉන්දියානු ඇඳුම් පිටින්ම මා ඉදිරියට බඩ ගාගෙන යද්දී "එපා, එපා එපා" යි කියන කට හඬක් මට ඇසුණා.

1991 දී මම පස්වන වරට බාබා දැකීමට ගියා. "ඔබ මීට කලින් මෙහෙ ඇවිත් තියෙනවා, නමුත් එතකොට පැවිද්දෙක් නෙමේ" යයි බාබා මට කීවා. ඒ කලින් කී සිද්ධිය සිහිපත් කරමින් කියා මට හිතුණා. ඒ වනවිට මම බ්‍රහ්මචාරී 'ක්‍රියානන්ද'.

## ක්‍රිෂ්ණමූර්ති සමග

1971 දී මා පළමු වරට ජේ. ක්‍රිෂ්ණමූර්ති (1895-1986) නම් දාර්ශනිකයාට සවන් දුන්නේ ඇම්ස්ටර්ඩෑම්හිදී. මගේ මතකයේ හැටියට 1973 දී මදුරාසියේ අද්‍යාර්හි ග්‍රීන්වේස් පාරේ 'වසන්ත විහාර්'හිදී ත් 1974 දී ස්විට්සර්ලන්තයේදී ත් ඔහුගේ දේශනාවලට කන්දුන්නා.



1976 පටන් මම හැම අවුරුද්දේම ඉන්දියාවේ අද්‍යාර්හි ක්‍රිෂ්ණමූර්තිගේ දේශනා ඇසීමට තවත් ලාංකිකයන් කීපදෙනෙක් සමග ගියා. ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් සහ එස්.එම්. ජයතිලක ද ඒ අය අතර සිටියා.

එක් අවස්ථාවකදී ක්‍රිෂ්ණමූර්ති සමග සිටින පින්තූරයක් ගන්නැයි කියා ලංකාවේ මිත්‍රයන් මට කීවා. ඒ වනවිට ඔහු අද්‍යාර් වෙරළේ පරම විඥානාර්ථ සමාගමට නුදුරු බිම් තීරුවේ අප දෙසට ගමන් කරමින් සිටියේ. ඉදිරියට පැන ඡායාරූපයක් නොගෙන "අර දෙන්නාත් සමග ඔබගේ පින්තූරයක් ගන්නට පුලුවන් දැ" යි මම ඇසුවා. "ඒ අයගේ පින්තූරය ගන්නැ" යි ඔහු කීවා.

"මං දානටමත් අරගෙන ඉවරයි" මා කී විට "තවත් එකක් ගන්නැ" යි කියමින් ක්‍රිෂ්ණජී මා බදාගනිමින් ඉක්මණින් දුව ගියේ පින්තූරයක් ගැනීමට ඉඩ නොදෙමින්.

පරම විඥානාර්ථ සංගමයේ නැවතී සිටි අතරතුර කාන්චිපුරම්හි **ශංකාරාචාර්යයා** දක බලාගැනීම සඳහා මම එහි ගියා. (ඔහු ඉන්දියාවේ සිටි ශංකාරාචාර්යයන් සිව්දෙනාගෙන් එක් අයෙක්.) මගේ ප්‍රශ්ණ රාශියක්ම දෙමළ බසට පෙරළීමට සමත් තරුණ ද්‍රවිඩ යහළුවෙකු සමගයි මම ගියේ. ආශ්‍රමය තුළ ඔහුගේ කුටියට ගිය අපට දක්නට ලැබුනේ මුළු සිරුර පුරාම 'විභූත' (ශුද්ධ අළු) තවරාගෙන මේසයක් මත හිඳගෙන සිටි අයෙකුයි. ඔහු නිශ්චලව සිටි නිසා අපට කතාකිරීමට බැරිවුණත් ඔහු දෙස බලා සිටීමෙන් සහ ඔහුගේ සිරුරින් ප්‍රබල රැස් දහරා පිටවන බව දනෙද්දී හිරු එළියට හිම දියවෙන්නාක් මෙන් සියළු ප්‍රශ්ණ දියවී ගියා.

ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඔරිස්සාහි පූරි නම් ස්ථානයේ සිටි ශංකාරාචාර්යයා බැලීමට ගිය අවස්ථාවේදී ඔහු කීවේ දෙවියන් අයදීමට හොඳම විධිය 'රාමා' යයි කිය කියා සිටීම බවයි.

මම පූරිහිදී යෝගානන්දයන්ගේ ශිෂ්‍ය ස්වාමි හරිහරානන්ද බැහැදැකීමට ගියත් ඔහු විදේශගතවී සිටීම නිසා ඔහු හමුවූයේ නෑ.

මම දකුණු ඉන්දියාවේ කේරළ ප්‍රදේශයේ කල්ලඩි නම් ස්ථානයට ගිය ගමනකදී 'ස්වාමි නිකාය' සොයාගත් ශංකාරාචාර්යයා ලෙස හැඳින්වෙන **ආදිශන්කරගේ** ස්ථම්භය වෙත ගියා. ඉන්දියාවෙන් බුද්ධාගම තුරන් කිරීමට වගකිවයුත්තා ලෙසයි ඔහු සැලකෙන්නේ. ඒ ඔහු බුද්ධාගමේත් හින්දු ආගමේත් වෙනසක් නෑ'යි කියමින් කිසිවෙකුට බුද්ධාගම වළඳ ගැනීමට අවශ්‍යතාවයක් නැතැයි කියාසිටි නිසා.

1991 දී මම නැවත ඉන්දියාවට ගියේ අපගේ Inter-Religious Dialogue නමින් හැඳින්වෙන අන්තර් ආගමික සංවාදයට සම්බන්ධ ජර්මන් ජාතික සාමාජිකයකු සමගයි. අපි දකුණු ඉන්දියාවේ ස්ථාන කීපයකට ගියා. ඒ ගමනේදී සත්‍ය සායි බාබා සමගත් කතාබස් කළා.

ලංකාවෙන් අනගාරික ධර්මපාලතුමා සහභාගිවූ අමෙරිකවේ චිකාගෝ නුවරදී පැවැත්වූ ආගම් පිළිබඳ ලෝක පාර්ලිමේන්තුව (World Parliament of Religions) නම් සම්මේලනයට සහභාගිවී ස්වාමි විවේකානන්ද දේශනයක් පවත්වා හරියටම වසර 100 කට පසුව 1993 දී සම්මේලනය පැවැත්වුණා. මෙවර ඊට සහභාගි වූ **ස්වාමි චින්මයානන්ද** එහිදී මිය ගියා. මා දිල්ලි නුවරදී දී බිම වාඩිවී ඔහුගේ සිරුර

දැක ගැනීමට තරම් වාසනාවන්ත වූවා. මා එතැනට කැඳවාගෙන ගිය සික් ජාතිකයා "බලන්න, ස්වාමි සිනහ වෙවී ඉන්න හැටි! හරියට 'මම ඔය හැමෝම පරාජය කළා' යි කියනවා වගේ"යයි කීවා මට මතකයි.

කෝචීන් ගුවන් තොටුපලෙහිදී අපි **අම්රිතනන්දා මායි** මැණියන් මුණගැහෙන්න ගියා. අපේ පිරිස අතර අන්තර් ආගමික සංවාදයේ නිර්මාතෘ ජර්මන් ජාතික රයින්හාඩ් ෂොන් කියර්ෂ්බාඃ දේවගැතිවරයා ප්‍රමුඛ නියෝජිතයින් කීපදෙනකේ සිටියා. **ක්විලොන්හි** පදිංචිවී සිටි මැණියන් අපට හමුවුණේ ලෝක ආගමික සම්මේලනයට සහභාගී වී ආපසු එද්දී. වරක් ඇයගේ ආශ්‍රමයේදී ඇයගේ සිප වැළඳගැනීමකට ලක්වීමට මට නොහැකි වුණත් මෙවර ඇයට මල් මාලාවක් පැළඳවීමට මට අවස්ථාව ලැබුණා. ඇය මෙවර මා වැළඳගන්නා විට ඇයගේ කර වටා විශාල මල් මාලා අඩු වශයෙන් පහක් වත් තිබුණ නිසා මට ඇගේ 'සියළු සත්වයන් කෙරේ දක්වන ආදරය' විඳගැනීමට නොහැකි වූවා. ඇයගේ භක්තිකයන් කියන්නේ ඈ වෙතින් ශක්ති මාලාවන් පිටවන බවයි.

# ආපසු බෝට්ටු ගෙදරට

හය මසකට වලංගු වීසා බලපත්‍රයක් ඇතුව පැමිණි මට 1973 මැයි මාසය වනවිට ඉන්දියාවෙන් පිටවී නැවත අළුත් වීසා බලපත්‍රයක් ලබාගෙන ආපසු ඒමට සිදුවුණා. බස් සහ දුම්රිය මගින් ඕලන්දය බලා යෑමට මම තීරණය කළා.

මා අත තිබූ මුදල් ඉවර වෙන්නට ලංව තිබූ නිසා මගේ මව්පියන්ගෙන් ඇමරිකන් ඩොලර් 200 කට චෙක්පතක් ලබා ගත්තා. අවාසනාවකට එය මාරු කරගැනීමට ඉන්දියාවේ ඇමෙරිකන් එක්ස්ප්‍රස් කාර්යාලයට ගිය අවස්ථාවේ අත්සනෙහි වෙනසක් නිසා එය මාරු කරන්න බැරියයි කීවා. මා නැවතී සිටි පවුලට මගේ කැමරාව විකුණා ලැබුණු මුදල හා මගේ අතේ තිබුණු මුදලත් රැගෙන ගමන යෑමට පිටත් වූවා.

මම අම්රිත්සාර් සිට යුරෝපය දක්වා දුම්රියෙන් පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය, ඉරානය හා තුර්කිය හරහා ගමන් කළා. අතරමගදී චෙක්පත මුදල් කරගැනීමට මා උත්සාහ කළත් වැඩක් වූයේ නෑ.

මගේ මාපියන්ගෙන් ලිපි තිබේදැයි දැනගැනීමට ඇෆ්ගනිස්ථානයේ අගනුවර වන කාබුල් නගරයේ තැපැල්හලේ මා පෝලිමේ සිටිද්දී කාන්තාවක් සමග මම කතාවට වැටුණා. ඇය ඇම්ස්ටර්ඩෑම්හි ජීවත්වන ඇමෙරිකානු කාන්තාවක්. ඇම්ස්ටර්ඩෑම් වෙත ගිය විට ආපසු දෙන පොරොන්දුව පිට ඇගෙන් ඩොලර් 50 ක් ඉල්ලා ගැනීමට මට පුලුවන් වුණා. ඇය මා විශ්වාස කර මට මුදල් දුන්නා. පොරොන්දුවූ හැටියට මම ඇම්ස්ටර්ඩෑම්හිදී ඇයට ඒ මුදල ආපසු දුන්නා.

ආපසු මගේ බෝට්ටු ගෙදරට පෙරලා ගිය මම බැංකුවක සුළු රැකියාවක් කරමින් ඉන්දියාව බලා ආපසු යන්නට මුදල් එකතු කරන්නට පටන්ගත්තා. මා ආපසු යන්න වැඩියෙන්ම උනන්දුවුණේ මා ඉන්දියාවෙන් පිටත් වීමට මොහොතකට පෙර එහි එක්තරා තැපැල්හලක පෝලිමකදී මට හමුවූ සාධුවරයෙකු දුන් පොරොන්දුවක් නිසා. (මා ගිය ගිය තැන තැපැල්හල් මට වාසනාව ගෙනාවා!) ඔහු ස්වාමි

යෝගානන්දගේ ප්‍රමුඛ පෙළේ ගෝලයෙක් - නමින් ස්වාමි ඕම්කාරානන්ද ගිරි. මා ඕලන්දයේ සිටියදී ඔහු මට ලිපියක් එවමින් මා පෙරලා ඉන්දියාවට පැමිණියහොත් තමන්ගේ සිසුවෙකු ලෙස මා භාරගැනීමට කැමති බව දන්වා එවා තිබුණා. මට ඔහුගේ ආශ්‍රමයේ නතර වීමට පුලුවන් බවත් ලිපියේ කියා තිබුණා.

1974 සැප්තැම්බර් මාසයේදී මා එක් මාසයකට පමණක් වලංගු වීසා බලපත්‍රයකින් ඉන්දියාවට ළඟා වූණා. ඉන්දියාවේදී මගේ වීසා බලපත්‍රය දික්කර ගන්නට පුලවන් කියා ඉන්දියානු තානාපති කාර්යාලය මට කීවත් වීසා බලපත්‍රයේ කල් ඉකුත් වෙද්දී එය ගොඩබැසීම සඳහා පමණක් වූ වීසා බලපත්‍රයක් නිසා දික් ගැස්සීම කළ නොහැකි බව දැනගන්නට ලැබුණා. ඒ නිසා වෙනත් රටකට යෑමට මට සිදුවූ බැවින් නේපාලයට යෑමට මම තීරණය කළා.

මා නේපාලයේ අගනුවර වන කත්මන්ඩු දක්වා දුම්රියෙන් යද්දී මා ගමන් ගත් පෙට්ටියේම ශ්‍රී ලාංකික භික්ෂුවක් සිටියා. අප කොතරම් මිතුරු වූයේද කියනවා නම් තමාගේ චපාති හා පරිප්පු කෑම පංගුව මා සමග ඔහු බෙදා හදා ගත්තා. ඊළඟ වතාවේ වීසා දික්කර ගන්නට ශ්‍රී ලංකාවට යන්නැයි ඔහු මට කීවා. බුද්ධ ධර්මය ගැන උනන්දු යයි ඔහු සමග කීවාම ඔහු මට වජිරාරාමයේත් කඳුබොඩ විපස්සනා මධ්‍යස්ථානයේත් පිටිපන හා ඇතුල්කෝට්ටේ පන්සල් දෙකකත් ලිපිනයන් දුන්නා.

# නැවෙන් ලංකාවට

1975 මැයි මස 1 වනදා මම ඉන්දියාවේ ඉඳන් ලංකාවට ආවා. රාමේශ්වරම් සිට තලෙයිමන්නාරම දක්වා නැවකින් ඇවිත් එතනින් දුම්රියෙන් අනුරාධපුරය දක්වා ආවා. මට ඕනෑකම තිබුණේ අනුරාධපුරයේ සිද්ධස්ථාන දැකබලාගන්න.

වන්දනීය ස්ථාන කීපයක් දැක බලාගෙන දුටුගැමුණු විශ්‍රාම ශාලාවේ නතර වීමට මම තීරණය කළා. එය වන්දනාකරුවන් නවාතැන් ගන්නා තැනක් බව දැනගෙන ඒ පැත්තට යද්දී බත් පැකට් විකුණන කෙනෙක් මට හමුවුණා. ඔහුගේ නම බුද්ධදාස. මම විශ්‍රාම ශාලාවේ නතරවෙන්න යන බව ඔහු දැනගත්තාම ඔහුගේ ගෙදර නතර වෙන්න පුලුවන් බව ඔහු කීවා. මමත් කැමතිවෙලා ඒ ගෙදර නැවතුණා. අනුරාධපුරයේ ජන කෞතුකාගාරයේ භාරකාරයාත් ඒ ගෙදර නතර වී සිටියා. නමින් ගුණසේකර කෙනෙක්වූ ඔහුගෙන් පුරාණ කාලයේ තොරතුරු රැසක් මම දැනගත්තා. වැඩියෙන්ම ලංකාවේ පළමුවෙනි අගනුවර වූ අනුරාධපුරයේ ඉතිහාසය ගැනත් පුරාණ රජවරු බුද්ධාගම වැළඳගත්තායින් පසු වෙහෙර විහාරවල් සෑදූ හැටිත් ඔහු විස්තර කළා.

මම ටික දවසකින් කොළඹ ගිහින් පන්සලක නතර වීමට අදහස් කරන බව ඔහු සමග කීවාම ඔහු මට නුගේගොඩට කිට්ටු පාගොඩ පන්සලක ලිපිනයක් දුන්නා. කොළඹට ටිකක් දුරින් පිහිටි එම පන්සල ඉදිරිපිට නිවසේ පදිංචි ඔහුගේ මවට දෙන්නට කියා ඔහු මට ලිපියක් ද දුන්නා. ඇය පන්සලේ කාන්තා සමිතියේ සාමාජිකාවක් බව මට කීවා.

අනුරාධපුරයේ සතියක් ගත කළ මම දුම්රියෙන් කොළඹ ආවා. කොටුවේ දුම්රිය ස්ථානයෙන් බැස මා පාගොඩ පන්සලට යන හැටි දැනගන්න මම වටපිට බලමින් සිටිද්දී ඉංග්‍රීසි දන්නවා ඇතැයි සිතුණු තරුණයෙකු දැක ඔහු ළගට ගිහින් 'පැගෝඩා' වලට යන්නේ කොහොමදැයි කියා ඔහුගෙන් ඇසුවා. මට යන්න අවශ්‍ය පාගොඩ බව දැනගත් ඔහු ඔහු මාර්ග අංක 114 දරන බස් රථයකට මා ගොඩ කළා. මම කිසිම කරදරයක් නැතිව අනුරාධපුර කෞතුකාගාරය භාරකරුගේ අම්මා

වූ ක්ලේරා ගුණසේකර මහත්මියගේ නිවස ඉදිරියෙන් බැස්සා. ඇය සිය නිවෙස ආසන්නයේ පිහිටි පන්සලට මා කැඳවාගෙන ගහින් නායක හාමුදුරුවන්ට හඳුන්වා දුන්නා.

මා කැමති කාලයක් මට පන්සලේ නතර වෙන්න පුලුවන් බව කියමින් නායක හාමුදුරුවෝ මට පන්සලේ කාමරයක් දුන්නා. කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට යන්න කැමති බව කීවාම මට කැමති වේලාවක ගිහින් ආපසු පන්සලට එන්නැයි නායක හිමියන් කීවා. පණ තිබෙන තාක් කල් එහි මට නැවතී සිටිය හැකි බවත් උන්වහන්සේ කියා සිටියා.

එදා හැන්දෑවරුවේ තරුණයෙක් පන්සලට ආවා. ඔහු පැමිණියේ අසනීප වී රෝහලේ සිටින සිය පියාට සෙත් පැතීමට පිරිත් දේශනාකරන්න භික්ෂූන් කීප නමක් වඩම්මා ගෙන යන්නට. ඔහු මා දැක "මාව මතකද" කියා මගෙන් ඇසුවා. මම ටික වේලාවක් කල්පනා කරද්දී "මම තමයි ඔබව බස් එකට ගොඩ කළේ" කියා ඔහු කීවාම මට ඔහු ගැන මතක් වුණා. 'උදෙත් හම්බවුණා - දැන් ආයෙත් හම්බවුණා. මොන තරම් ආශ්චර්යකද‍ැ' යි මට සිතුණා. තරුණයා වාමාංශික නායකයෙකු වූ වාසුදේව නානායක්කාරගේ සොයුරු හේමකුමාර නානායක්කාර බව පසුව දැනගත්තා. ඔහුත් 2001 දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්වී එක්සත් ජාතික පක්ෂ ඇමතිවරයෙකු ලෙස කටයුතු කර පසුව තමා ගේම පක්ෂයක් පිහිටුවා ගත්තා. 2015 දී දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස පත්කෙරුණා.

මම පාගොඩ ශ්‍රී විද්‍යා විජයාරාමයේ නතර වෙන්න තීරණය කළා. මට ඕනෑ තරම් කල් නතරවෙන්නැයි කීවේ දවුල්දෙන ඤාණිස්සර නායක හිමියන්. උන්වහන්සේ අඩුම ගණනේ භාෂා අටක් දැන සිටි බහුශ්‍රැත සඟරුවනක්.

වසර 101 ක් දිවි ගෙවා 2017 අප්‍රියෙල් 3 වන දා අපවත්වූ උන්වහන්සේ ඒ වන විට ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක පදවිය හෙබවූවා. උන්වහන්සේ ඒ තනතුරට පත් වූයේ අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමියන් ගෙන් පසුවයි. අමරපුර නිකායේ උප නිකාය 21 කම නියෝජනය කරන්නේ උත්තරීතර මහානායක හිමියන්.

මම අද දක්වා ඉන්නේ පාගොඩ ප්‍රදේශයේම වූ ආරාමයක, නායක හිමියෝත් පසුකාලයේ මා සිටි පන්සලටම පදිංචියට වැඩියා.

භාවනා කිරීමට මා දැක්වූයේ ලොකු උනන්දුවක්. ඒ නිසා මම කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට ගිහින් සති තුනක් එහි ගත කළා. ඉංග්‍රීසියෙන් කතාබස් කිරීමට පුලුවන් වූ කටුකැලේ සීවලී හිමියන් එහිදී හමුවීම මට ලොකු රුකුලක් වුනා. ඒ සුප්‍රසිද්ධ විපස්සනා භාවනා මධ්‍යස්ථානය අරඹන ලද්දේ සම්බුද්ධ ජයන්තිය හෙවත් බුද්ධ පරිනිර්වාණයෙන් වසර 2500ක් සම්පූර්ණවීම සැමරූ 1956 දී. මධ්‍යස්ථානයේ ලොකු හාමුදුරුවෝ කහටපිටියේ සුමතිපාල නායක හිමියන්.

කොළඹ සිට කඳුබොඩට කිලෝමීටර් 30 ක පමණ දුරක්. යෑම ඊම පහසුවුණා. මධ්‍යස්ථානයේ සාන්ත පරිසරය බෙහෙවින්ම මගේ සිත ගත්තා. කිසිම කරදරයක් නැතිව භාවනා කරන්නට ඉඩ ලැබීමෙන් මගේ උද්යෝගය තවත් වැඩිවුණා.

ඇත එද්දීම සීවලී හිමියන්ට මගේ සිත කියවීමට පුලුවන්වීම ගැන මම පුදුම වුණා.

මම ආපසු පාගොඩට ඇවිත් ටික දිනකින් දෙවෙනි වතාවටත් සති තුනක භාවනාවක් කිරීමට ලැබීම හොඳ අත්දැකීමක් වුණා. ඒ වතාවේ මුළුමනින්ම නිහඬවයි භාවනාකළේ. කෙළවරවෙද්දී මම දැනගත්තා මා යායුතු මග මොකක්ද කියා.

ඉන්දියානුවන්ගේ යෝග මගින් හෝ භාවනාව මගින් කවදා හෝ දෙවියන් සමග එක්වීමට පුලුවන් වුවත් විපස්සනා භාවනාවෙන් වර්තමානයේදීම දුකින් මිදීමට පුලුවන් බව ඒත්තු ගියා.

# භික්ෂු ජීවිතය ඇරඹියි

ශ්‍රී ලංකාවේ හය මාසයක් ගත කිරීමට සංචාරක වීසා බලපත්‍රයක් මට ලැබී තිබුණා. එයින් මාස පහක් ගතවූ තැන මම කල්පනාකලා ආපසු ඉන්දියාවට යනවාද නැත්නම් මහණ වී ලංකාවේ නවතිනවාද කියා. මා මහණවීමට කැමැත්තෙන් සිටින බව මගේ ගුරු හාමුදුරුවන්ට කීවාම ඒ සඳහා මව්පියන්ගෙන් අවසර ගතයුතු බව උන්වහන්සේ කීවා. මා අවුරුදු විසිහතක තරුණයෙක්; මා කැමති දෙයක් කරන්නට දෙමව්පියන්ගෙන් අවසර ගන්නේ ඇයි කියා මට හිතුණා. "ඒ තමයි පරම්පරාගත බෞද්ධ චාරිත්‍රය" යි උන්වහන්සේ කීවා.

නිදහස් චින්තකයන්වූ මගේ දෙමව්පියන් මානුෂීය වශයෙන් සමබර ආකල්පවලින්ද යුක්ත වූ නිසා මට අවසර දෙන බව විශ්වාසයි. ඒ 'ඊ මේල්' හෝ ජංගම දුරකථනයක් තියා පන්සලේ සාමාන්‍ය ටැලිෆෝනයක් වත් නොතිබූ යුගයක්. මම දෙමව්පියන්ට ලිපියක් යැව්වා. වහාම මට ලැබුණු පිළිතුරෙන් කියැවුනේ අන් කිසිවෙකුගේ බලපෑමකින් තොරව තමාගේ නිදහස් තීරණයකින් භික්ෂුවක් වන්නේ නම් ඔවුන් විරුද්ධ නොවන බවයි.

මේ අතර මම රටේ නම්දැරූ උගත් භික්ෂූන්වහන්සේලා බැහැදැකීමට පටන්ගත්තා. අතිගරු බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහානායක හිමියන් පන්නිපිටියේ උන්වහන්සේගේ පන්සලෙහිදී මට හමුවුණා. බම්බලපිටියේ වජිරාරාමයේදී ගරුතර නාරද හිමියන් මෙන්ම ගරුතර පියදස්සී හිමියන් ද මම බැහැදැක්කා. අතිගරු මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන් හා ගරුතර අම්පිටියේ රාහුල හිමියන් ද මහරගම භික්ෂු පුහුණු කේන්ද්‍රයේදී මට මුණගැසුණා. මහරගම ධර්මායතනය නමින් හැඳින්වුණු එහි සිටි ශිෂ්‍ය භික්ෂූන්ට දවුල්දෙන හිමියෝ ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූවා.

ලංකාවට පැමිණ ථෙරවාද භික්ෂුවක් සේ පැවිදිවූ ජර්මන් ජාතික අතිගරු ඤාණපෝනික මහා ස්ථවිරයන් වහන්සේ මා මුණගැසුණේ මහනුවරදී. උගත්

භික්ෂුවකවූ උන්වහන්සේ විසින් පිහිටවනු ලැබූ බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශක සංගමය විසින් පළකෙරෙන බෞද්ධ පොත්පත් ලොව පුරා විසුරුවා හරිනු ලබයි.

මේ වනවිට මා කෙස් කොට වෙන්නට කපා සුදු සරමක් අඳින්න පුරුදුවී සිටියා.

1975 සැප්තැම්බර් 21 වනදාට මා නැවතී සිටි ආරාමයේම පැවිදිවීමට තීරණය කළා. ඊට දින කලින් ජෙහෝවා අනුගාමිකයෝ (Jehova's Witnesses) දෙදෙනෙක් බයිබලයක්ද රැගෙන පැමිණ මා බුද්ධාගම වැළඳගන්නේ ඇයිදැයි මගෙන් ඇසුවා. ඔවුන් මට දෙවියන් ගැන විස්තර කරන්නට පටන්ගත්තා. ටික වේලාවක් ඔවුනට කන්දී මා කිව්වා 'දෙවියන් කියන්නේ කවුදැයි මා දන්නේ නෑ. දෙවියන් කවුරුදැයි සොයාගත්තොත් මම ආපසු ආගමට එන්නම්' කියා.

මගේ පැවිදි වීමේ චාරිත්‍ර වාරිත්‍රවලට අමතරව දේශනයක් පවත්වන්නට බෞද්ධ දර්ශනය පිළිබඳ මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්නයන්ට ආරාධනා කළා. පැවිදි උත්සවයට දින දෙකකට කලින් ඔහු මා හමුවී, බුදු සමය හා පාලි උගත් නෙදර්ලන්තවාසී කාන්තාවක් ශ්‍රී ලංකාවේ සිටින බවත් පැවිදි උත්සවයට එන්නට කැමති බවත් කියා ඒ ගැන මගේ විරුද්ධත්වයක් ඇද්දැයි ඇසුවා. මගේ ජීවිතයේ ඉතා වැදගත් අවස්ථාවක නෙදර්ලන්තයේ කෙනෙකු සිටීම ගැන මට ඇතිවූයේ බලවත් සතුටක්. පුවත් පත් මගින් උත්සවය ගැන කියවා තිබූ රියා ක්ලොපන්බර්ග් (Ria Kloppenborg) උත්සවයට සහභාගි වීම ඇයට අළුත් අත්දැකීමක් වූවා.

මා පැවිදි බව ලැබුවේ අමරපුර නිකායේ ප්‍රධාන සංඝනායක (1975) ගරුතර කොස්ගොඩ ධම්මවංශ මහනාහිමියන් වෙතින්. මගේ උපාධ්‍යායානන් (ගුරුවරයා) වූයේ දවුල්දෙන ඥාණිස්සර හිමියන්.

පැවිදි උත්සවයට සහභාගි වීමට නොහැකි වූ මගේ දෙමව්පියෝ 1975 දෙසැම්බර් මාසයේ මෙහි පැමිණ රට පුරා සංචාරය කරමින් ස්ථාන රැසක් නරඹා ලොකු ආස්වාදයක් ලබාගත්තා.

භාවනාව ගැන තිබුණු උනන්දුව නිසා මම මාස තුනක් කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයේ නැවතී සිටියා. පැවිදි වූ පසු ආචාර්ය උපාධ්‍යායාණන් වහන්සේ යටතේ පස් වසරක් සිටිය යුතු බව මම දැනසිටියේ නෑ. ඒ අතර වැඩි උෂ්ණයක් නැති සිසිල් ප්‍රදේශයක නිහඬව භාවනා කළ හැකි තැනක් ද සොයන්න පටන්ගත්තා.

මගේ උපසම්පදාවට කලින් අසල්වැසි රටවල වන්දනාවේ යෑමට ද මම තීරණය කළා. මේ අතර මට අවුරුද්දක් වලංගු විසා බලපත්‍රයක් ලැබුණා.

## බෞද්ධ රටවල වන්දනාවේ

1976 අග භාගයේදී මම වන්දනාගමනට පිටත්වුණා. අප ගමන්ගත් 'ට්‍රයි ස්ටාර්' අහස්යානය ගමන ඇරඹූ මොහොතේම යාන්ත්‍රික දෝෂයක් ඇති වී එක් එන්ජිමක් ගිනිගෙන මුහුදට පහත් වන බව අපට දැනුණා. කෙසේ හෝ යානය හරිමගට ගෙන ආපසු කටුනායක ගුවන් තොටුපලට ගෙන ඒමට නියමුවා සමත් වූණා. පැය දෙකක පමාවකින් පසු අපි ගමන් ඇරඹුවා.

ඉන්දියාවෙන් වන්දනා ගමන අරඹා මුලින්ම ගියේ සිදුහත් කුමරු බුද්ධත්වයට පත්වූ බුද්ධගයාවට. අනගාරික ධර්මපාලතුමා (1864-1933) හින්දු පාලනයෙන් බේරාගත් පසු බුද්ධගයාව පරිපාලනය කරනුයේ ඉන්දියාවේ පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්. ධෛර්යසම්පන්න ශ්‍රී ලාංකික වීරයා ඉතා අමාරුවෙන් සටන් කොට බෞද්ධ සිද්ධස්ථාන බේරාගත් පසුව පිහිටුවා ගත් මහාබෝධි සංගමය විසින් අද දක්වා ඉන්දියාවේ බෞද්ධ කටයුතු මෙහෙයවනවා.

මා මුලින්ම ඉන්දියාවට පැමිණි අවස්ථාවේ මා නතර වී සිටි පවුල දැක ගැනීමට රාන්චි බලා ගිය මම ඔවුන් මා බුදු දහම අනුගමනය කළයුතු යයි දුන් උපදේශය ගැන මහත් සේ කෘතඥතාවය පළකළා. හින්දු යෝගියෙකු වශයෙන් මා තවදුරටත් කටයුතු කළයුතු බව කී ඕම්කාරානන්ද සාධුවරයා දැකීමට ද මම ගියා.

## නේපාලය හරහා බුරුමය කරා

මා නේපාලයේ කත්මන්ඩු අගනුවර පන්සලකට ගිය අවස්ථාවේ මම නෙදර්ලන්ත භික්ෂුවක බව එහි සිටි භික්ෂුවට කීවා. ඔහු මට කීවේ නේපාලයේ ථේරවාද බුදු සමය ගැන පර්යේෂණයක් කරන නෙදර්ලන්ත කාන්තාවක් එනතෙක් තමා බලාගෙන සිටින බවයි. ඒ කාන්තාව මගේ පැවිදි උත්සවයට පැමිණි මහාචාර්ය රියා ක්ලොපන්බර්ග් බව මම එකවරම දැන ගත්තා. එය කොතරම් නම් අහඹු සිදුවීමක් දැයි මට සිතුණා.

බුරුමයට ගිය ගමන විශේෂ වූවක්. වැඩි කාලයක් එහි නතර වීමට මා හිතුවත් මට වීසා දුන්නේ දින හතකට පමණයි. ඉංග්‍රීසි බස හොඳින් නොදත් චීන භික්ෂුවකට ගොඩබැසීමේ අවසර පත පිරවීමට මම උපකාර කළාට පසු රැන්ගුන්හි පිහිටි සිය ආරාමයේ නැවතීමට ඔහු මට ඇරයුම් කළා. ඔවුන්ගේ ජීවන රටාව ගැන දැනගැනීමට එයින් මට අවස්ථාව ලැබුණා. බිත්තිවල එල්ලා තිබූ චීන චිත්‍ර හා ශ්‍රී ලංකා චිත්‍ර අතර ඇති වෙනස මම දැක්කා. ලංකාවේ චිත්‍රවල රහතුන් වහන්සේලා සියළු දෙනාගේම රුව ඒකාකාරයි. චීන චිත්‍රවල ඊට වෙනස්. ඒවා එක් කොටසකින් රහතුන්

වහන්සේලා නව දෙනෙකු බැගින් කොටස් දෙකකට වෙන් කරලා. මුහුණුවලින් පෙන්නුම් කරන හැඟීම් එකිනෙකට වෙනස්. සමහර ඒවා ප්‍රියංකර මුහුණු. දැඩි බැල්මකින් යුත් මුහුණු ද තිබෙනවා.

මණ්ඩලේ ආසන්නයේ වූ ෂ්වෙබු (Shwebu) නම් ස්ථානයේ ආරාමයක් තැනීමට ආධාර කළ ශ්‍රී ලාංකික කාන්තාවක් වූ අයෝමා වික්‍රමසිංහ දුන් හැඳින්වීමේ ලිපියක් මා අත තිබුණා. වෙබු සයාඩෝ නම් සුප්‍රසිද්ධ මහතෙරුන් වහන්සේ වාසය කළේ ෂෙබූ ආරාමයේ. රහත් හිමිනමක් බව ප්‍රකට මේ හිමිනම මාව සාදරයෙන් පිළිගනු ලැබුවා. මා සමග කථාබහ කිරීමට උන්වහන්සේ බොහෝ කැමැත්තක් දක්වූවා. බුද්ධාගමේ මූලික ලක්‍ෂණයක් වූ මෛත්‍රී කරුණාව උන්වහන්සේ ගෙන් සංකේතවත් වුණා වගේම රහතන් වහන්සේ නමක් බව කියැවෙන, මහසි සයාඩෝ නම් තවත් නායක හිමිනමක්ද එහිදී මට හමුවුණා. උන්වහන්සේගේ පිළිගැනීමෙහි හිතවත් බවක් තිබුණේ නෑ. ධර්මය හා සම්බන්ධ දෙයක් පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටියාම පොත් රාක්කයක් පෙන්වා මට උදව් කරනන්නැයි අතවැසියෙකුට කීවා.

වෙබු සයාඩෝ අපවත් වූ දිනයේ මුළු ශ්‍රී ලංකාවම අඳුරෙහි ගිලුණා. සමහරු කීවේ ඒ හිමියන් අපවත් නිසා බවයි. ඔවුන් ඒ තරමට ඔහුට ගෞරව කළ අතර ඔවුන් තුළ දැඩි විශ්වාසයක් ද තිබුණා.

මා ගිය රටවල විවිධ සිරිත් විරිත් දැනගැනීම මට කදිම අත්දැකීමක් වුණා.

## ආපසු ඉන්දියාවට

ශත වර්ෂ ගණනාවක් පුරා බුද්ධාගමේ ඇතිවූ වෙනස්කම් අධ්‍යයනය කරමින් මම ඉන්දියාව පුරා සංචාරය කළා.

බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදුන් වහන්සේ මුල් දහම් දෙසුම පැවැත්වූ සාරානාත්හි සහ නිතර ආ ගිය ශ්‍රාවස්තියේ ද ශාන්ත පරිසරය ගැන මම විශේෂයෙන් ආකර්ෂණය වූවා.

කුසිනාරාව බුදුන්ගේ පරිනිර්වාණය ගැන ශෝකාකුල හැඟීමක් ඇතිකරවන නිහඬ මෙන්ම ශාන්ත දාන්ත පරිසරයකින් යුත් තැනක්. එහි ගියාම බුදුන් පරිනිර්වාණයට පත්වෙද්දී උන්වහන්සේගේ ප්‍රධාන සිසුන් තුළ ඇතිවූයේ කුමන ආකාරයේ හැඟීමක්දැයි කෙනෙකුට සිතාගන්න පුලුවන්.

# අජන්තා හා එල්ලෝරා

සංචාරකයන් විශාල බලන්න යන දැවැන්ත අජන්තා සහ එල්ලෝරා ගුහාවන් බැලීමටත් මම ගියා. මහාරාෂ්ට්‍ර ප්‍රදේශයේ අවුරන්ගබාද් දිස්ත්‍රික්කයේ ඇති ඒවා යුනෙස්කෝ ලෝක උරුම ස්ථාන.

කළු ගලෙහි කැපූ ලෙන් 30 ක් පමණ ඇති අජන්තාවේ ලෙන් වල ක්‍රි.පූ. 2 වන සියවස දක්වා දිවෙන චිත්‍ර සහ ප්‍රතිමාවන් තිබෙනවා. ඉන්දියානු කලා ක්ෂේත්‍රයේ දූනට ඉතුරු වී ඇති විශිෂ්ට චිත්‍ර වන්නේ විශේෂයෙන්ම බුදුපිළිම හා ජාතක කථා දක්වෙන අති විශිෂ්ට බෞද්ධ කලා නිර්මාණයන් කියලයි ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව කියන්නේ.

ඉන්දීය ලෙන් ගෘහ නිර්මාණ ශිල්පයේ මුදුන් මල්කඩ විද්‍යාමාන වන්නේ එල්ලෝරාවේ. එහි ඇති ලෙන් 34 ඇත්තෙන්ම චනනන්ද්‍රි කඳු වැටියේ මුහුණත හාරා නිර්මාණය කරන ලද ඒවා. ක්‍රි.පූ. 5 ත් 10 ත් අතර සෑදූ ඒවා හින්දු, බෞද්ධ සහ ජෛන ලෙන් විහාර. ඒ කාලේ ආගමික සංහිඳියාව පිළිබිඹු කරන හින්දු ලෙන් 17ක්, බෞද්ධ ලෙන් 12ක් සහ ජෛන ලෙන් පහක් එකිනෙක ආසන්නයේ තනා තිබෙනවා.

මම ඉන්දියාවේ නාග්පූර්හි දීක්ෂභූමි වලට ද ගියා. පහත් කුලයක් (untouchables) ලෙස සැලකෙන කුලයක ලක්ෂ පහකට වැඩි පිරිසක් සමග ආචාර්ය බී.ආර්. අම්බෙඩ්කාර් බුද්ධ ජයන්ති වර්ෂය වූ 1956 ඔක්තෝබර් 14 වනදා පන්සිල් සමාදන් වී බෞද්ධයන් බවට පත්වීමෙන් පසු මේ ස්ථානය ඉන්දියාවේ බෞද්ධාගමික කේන්ද්‍රස්ථානය බවට පත්වුණා. එහිදී ආචාර්ය අම්බෙඩ්කාර්ගේ විශිෂ්ට අනුගාමිකයෙකු වූ ආචාර්ය ආනන්ද කෞෂල්‍යා යන මට හමුවූවා.

වන්දනා ගමන අවසන් කර 1977 ඔක්තෝම්බර් මස 13 වන දිනට නියමිත මගේ උපසම්පදාව සඳහා මම නැවත ශ්‍රී ලංකාවට පැමුණුනා.

# උපසම්පදාව ලබයි



මගේ උපසම්පදා පිංකම ගැන කීමට කලින් මෙන්න පිංකම කෙරෙන ආකාරය ගැන කෙටි සටහනක්. සිවුරු දරාගෙන සිය උපාධ්‍යායානන් යටතේ ධර්මය හදාරන සාමණේර භික්ෂුවකට උපසම්පදාව ලබා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලාගෙන් යුත් සංඝ සභාවක් ඉදිරියේ පෙනී සිටින්නට ඕනෑ. මුලින්ම සාමණේර භික්ෂුව වෙන් වෙන් වශයෙන් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් මුණගැහී තමන් උපසම්පදාව ලැබීමට බලාපොරොත්තු වන බව දැනුම් දෙනවා. සාමණේර භික්ෂුවක් හැටියට අවුරුදු කීපයක් සිවුරු දරා සිටියත් චාරිත්‍රයට අනුව උපසම්පදාව ලබා ගැනීමට කලින් ඔහු නැවත ගිහි ඇඳුමෙන් සැරසී උත්සවයට මොහොතකට කලින් සිවුර පොරවා ගන්න ඕනෑ. ඊළඟට ඔහු සිල්පද දහය සමාදන් වෙනවා.

උපසම්පදාව ලැබීමට සුදුසුද කියා සොයා බලන්නට සංඝ සභාව ඉදිරිපිටදී ප්‍රශ්ණ ගණනක් ඔහුගෙන් අහනවා. ලැජ්ජා නොවී අහන ප්‍රශ්ණවලට අවංකව උත්තර දෙන්නැයි ඔහුට කියනවා. තමා වයස අවුරුදු විස්ස ඉක්මවා ඇද්ද, ණයතුරුස් ඇති අයෙක්ද නැත්නම් රජයේ සේවකයෙක්ද, දෙමාපියන්ගෙන් අවසර ලබා ගත්තාද, බරපතල රෝගයකින් පෙළෙනවාද වාගේ ප්‍රශ්න ඔහුගෙන් අහනවා. තමා ළඟ පාත්තරයක් හා සිවුරු තිබෙනවාද කියාත් අහනවා. ධර්මය පිළිබඳ ඔහුගේ දැනුමත් පරීක්ෂා කෙරෙනවා.

උපසම්පදාව දීමට ඔහු සුදුසු යයි ජ්‍යෙෂ්ඨ භික්ෂූන් තීරණය කළොත් උපසම්පදාව දෙන ලෙස ඉල්ලීමක් කිරීමට ඔහුට කියනවා. උපසම්පදාව දුන්නාට පස්සේ එතැන් සිට ඔහු හැසිරිය යුතු ආකාරය ගැන ඔහුට උපදෙස් දෙනු ලබනවා.

මගේ උපසම්පදා උත්සවය පැවැත්වීමට නියමිත වූයේ අමරපුර එම නිකායේ මූලස්ථානය වූ බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම සපුගොල්ල විහාරයේදී.

මේ උත්සවයට මගේ දෙමාපියන් පැමිණ සිටියා. මුළු වැඩ සටහනම ඔවුන්ට අලුත් අත්දැකීමක් වුනා. ඒ පමණක් නොවෙයි නිතරම ඔවුන්ට විනෝදයක්ද ගෙන දුන්නා. මිලිමීටර් 8 ක කැමරාවකින් මගේ පියා එය රූගත කළා. ඔවුන්ට පමණක් නොවෙයි මටත් එය අලුත් අත්දැකීමක් වුණා.

උපසම්පදා පිංකම කලාතුරකින් සිදුවන්නක්. ඒ නිසා ඊට සූදානම් වීමේදී ලොකු සූදානමක් හා උද්‍යෝගයක් දක්වනවා. සාමණේර භික්ෂුව කැඳවාගෙන යනු ලබන්නේ නැට්ටුවන් සහිතව පෙරහැරකින්. අවට ජනයා පාර දෙපැත්තේ රැස්වෙලා බලාසිටිනවා.

ගිහියෙකු ලෙස මට නුහුරු ඇඳුමක් අන්දවනු ලැබුවා. එය රත් පැහැයෙන් හා රන් පැහැති අරුමෝසම් - 'නිලමෙ' ඇඳුමක්. කරදරකාරී ඇඳුමක් වුවත් මට එය අඳින්න වුනා. 'තවත් අත්දැකීමක් !' යයි මම සිතාගත්තා.

විහාරයට කිලෝමීටර් තුනක දුර පෙරහරින් යෑමට මට ඇතෙකු පිට නගින්නට සිදුවුණා. කුඹුරු හරහාත්, ගමේ අතු පාරවල් සහ මහ පාර දිගේද පෙරහැර ගමන් ගත්තා. මේ ගමනේදී ඇල දොල හරහා පවා යන්නට තිබුණා. පාරවල වලවල් ගොඩැලි. මගේ පිටරට ගමනෙන් පස්සේ මට උණ ගැණුන නිසා මගේ ශරීර සෞඛ්‍යය එතරම් හොඳ තත්වයක වූයේ නැති නිසා මට සෑහෙන වෙහෙසක් දැනුණා.

උත්සවය අවසන් වී අපි කොළඹට ඇවිත් ගල්කිස්ස හෝටලයේ රාත්‍රිය ගත කළා. ඊළඟ දවසේ මා පාගොඩ විහාරයට යායුතුව තිබුණත් රටේ පැවති කලබල නිසා එදින ඇඳිරි නීතිය පැනවූවා. කලින් පෙරහරක් ලැස්ති කර තිබුණත් දවස වෙනස්වූ නිසා මා තවත් දවසක් හෝටලයේ නතර වී කිසිම උත්සවයක් නැතිව පසුවදා විහාරයට ගියා.

# කඳුරට ආරාමයක



නිවීහැනහිල්ලේ භාවනා කිරීමට පුලුවන් සාන්ත පරිසරයක ආරාමයක් මම සොයමින් සිටිද්දී මට කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයේදී ෆින්ලන්ත ජාතික භික්ෂුවක් ගම්පල කිට්ටුව වේගිරිකන්ද ගැන කීවා. කඳුකර පෙදෙසක පිහිටි නිසා 'රොක්හිල් ආරාමය' නම්වූ ඒ ස්ථානයට ගියාම ඒ මා හොයමින් සිටි ආකාරයේ තැනක්. මා එහි ගිය අවස්ථාවේ ඇමෙරිකන් ජාතික භික්ෂුවක් එහි භාවනා පංති පවත්වමින් සිටිනවා දැක්කා.

එහි පරිසරයේ නිහඬ බවටත් ශාන්ත බවටත් කැමති වූ මම මගේ උපසම්පදාවෙන් පසු නැවත වරක් එහි ගියා. එවිට ඇමෙරිකන් භික්ෂුව ආපසු ගිහින්.

එහි නැවතීම ගැන කතාබහ කිරීමට කස්සප හිමියන් නොසිටිය නිසා ආපසු කොළඹ එන ගමනේ මහනුවරදී තැපැල් කරන්නට සිතා මම කස්සප හිමියන්ට ලිපියක් ලිව්වා.

මා මහනුවර වීදියක ඇවිදිමින් සිටියදී කව්දෝ මගේ උරහිසට තට්ටු කලා. ජර්මන් ජාතිකයෙක් වූ ඒ තැනැත්තා පාරේ නවතා තිබූ මෝටර් රියක සිටි භික්ෂුවක් වෙත ඇඟිල්ලි දික් කර ඔහුට මා සමග කථා කරන්නට උවමනා බව කීවා. ඒ මම ලිපිය ලියූ භික්ෂුව බව පෙනුණා. කොතරම් පුදුමයක්ද!

මම 1979 දී රොක්හිල් ආරාමයේ නැවතීමට ගියා.

එයත් තවත් අත්දැකීමක්. මගේ නවාතැන, අතු සෙවිලි කළ කුඩා ගෙපැලක්. යාබදව කාර්යාලයක් හෝ ගබඩා කාමරයක් හැටියට පාවිච්චි කෙරුණු අඳුරු ගල් ලෙනක්. එය 14 වන සියවසේ ගම්පල රාජධානිය සමයේ පටන් පැවත එන්නක් බව මට දැනගන්නට ලැබුණා. ලෙන මතුපිටට වැටෙන වැහි ජලය වෙනත් අතකට යැවීමට ලෙන මතුපිට ගලේ කටාරම් කොටා තිබුණා. ලෙන භික්ෂුන් පරිහරණය කර තිබුණු බව පෙනීගියා. ඒ අවධියේ රටේ නොසන්සුන්බව නිසා රජවරුන් තැනින් තැනට රාජධානිය මාරු කළා. හදිසි අවස්ථාවකදී රජතුමාට පැන යෑමට තැනූ රහස් උමගක් ලෙන ළඟ තිබුණු බව මට දැනගන්න ලැබුණා.

විදේශිකයන්ට භාවනා පංති පැවැත්වීමට එතැන පහසුකම් වැඩිදියුණු කිරීමට මම පටන් ගත්තා. මුලින්ම ලෙන පිරිසිදු කළා. මට නිදාගැනීමට තවත් මහලක් තැනුවා. ඉඩකඩ ඇති ශාලාවක් සහ කුටි කිහිපයක් එහි තිබුණා. භික්ෂුණී ආරාමයක් තැනීමට සකස්කර තිබූ සැලැස්මක් අනුව කල් නොයවා එයත් ඉදිකෙරුවා.

ආරාමය තිබුණු ඡන්ද කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූයේ ඩිංගිරි බණ්ඩා විජේතුංග මහතා. පසුකාලෙක අගමැති තනතුර ලැබීමට කලින් ඔහු අමාත්‍යාංශ කීපයක් භාරව කටයුතු කළා. ඔහු තැපැල් හා විදුලි සංදේශ ඇමතිව සිටියදී ආරාම භූමියේ තැපැල් කණුවක් සවි කළ නිසා විදේශීය භාවනානුයෝගීන්ට පහසුවෙන් ලියුම් තැපැල් කරන්න පුලුවන් වුණා. (ඒ කාලයේ ලැප්ටොප්, මොබයිල් ෆෝන් සහ වයිෆයි ගැන අසා තිබුනේවත් නෑ.) ඔහු ආරාමයට දුරකථන පහසුකම් පවා ලබාදුන්නා. ඔහු මහාමාර්ග ඇමති වූ කාලයේ ආරාමයට පැමිණීමට හොඳ පාරක් සාදා දුන්නා. විදුලි හා බලශක්ති ඇමතිවුනාම ආරාමයට විදුලි බලය ලබා දුන්නා. දුරබැහැර ආරාමයකට උපකාර කිරීමෙන් ඔහු ඇත්ත වශයෙන්ම පින් රැස් කරගත්තා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපති ඝාතනය කළාම ඔහු ලංකාවේ ජනාධිපති තනතුරට පත්වූවා.

මම සෑම මාසයකම දින 10 ක භාවනා වැඩසටහනක් පැවැත්වූවා. ඊට 15-20 අතර පිරිසක් සහභාගීවුණා. ඔවුන් අතුරෙන් වැඩිදෙනා විදේශිකයන්. ඒ අයට කලින් භාවනා වැඩසටහන්වලට සහභාගීවූ අයගෙන් ඔවුන්ට තොරතුරු ලැබී තිබුණා. ඔවුන්ගෙන් වැඩිදෙනෙක් ජර්මනියෙන් පැමිණි අය. මහනුවර බෞද්ධ ප්‍රකාශන සංගමයේ (BPS) තබන ලද අත් පත්‍රිකාවෙන්ද රොක්හිල් ආරාමය ගැන ප්‍රචාරයක් ලැබුණා.

# අන්තර් ආගමික සංවාදයට එක්වෙයි



විශ්‍රාමික ජර්මානු ලුතරන් දේවගැතිවරයෙකු වූ රයින්හාඩ් ෆොන් කයෂ්බැක් (Reinhard von Kirchbach) සංවිධානය කළ විවිධ ආගමික පුද්ගලයන්ගේ එකතුවකට සහභාගි වෙන්න රොක්හිල් ආරාමයේ අධිපති පොල්පිටියේ කස්සප හිමියෝ ගියා. රයින්හාඩ්ට වුවමනා වුණේ එක සමාන අදහස් ඇති විවිධ ආගම්වල පුද්ගලයන්ගේ කණ්ඩායමක් පිහිටුවන්න. ඔහු යුරෝපයේත් දකුණු ආසියාවේත් සංචාරය කරද්දී ඒ වගේ පිරිසක් ගැන සෙවිල්ලෙන් සිටියා. ඊළඟට ඔහු තමා විසින්ම තෝරාගත් පිරිසකට මුල්ම 'අන්තර් ආගමික සංවාදය'ට ආරාධනා කළා. හාපුරා කියා දෙමසක වැඩමුළුවක්වූ එය පැවැත්වුනේ ජර්මනියේ එකර්න්ෆෝඩ් (Eckernfoerde) ආසන්නයේ ඇල්ටෙන්හොෆ්හි ඔහුගේ නිවසේ.

ඊළඟ වසරේදීත් කස්සප හිමියෝ ඊට සහභාගිවුණා. 1982 දී මට එහි යන්න අවස්ථාව ලැබුණා. 1984 දී වැඩමුළුව පැවැත්වුණේ ලංකාවේ රෝක්හිල් ආරාමයේ. ඉන් පසු අවුරුදුවලදී සාමාන්‍යයෙන් නොකඩවා හින්දු, බෞද්ධ, ක්‍රිස්තියානි සහ මුස්ලිම් (ඉඳහිට යුදෙව්වන්ද) සහභාගිවූ සම්මේලන වලට මමත් ජර්මනිය, ප්‍රංශය, කේරලය, ජපානය, පකිස්ථානය, කාශ්මීරය, බාලි ආදි රටවලට ගියා. හැමෝම එක්ව ජීවත් වෙමින් භාවනා කළා. අනෙක් අයගේ ආගමික කටයුතුවලටද සහභාගි වුණා. එකට එකතුව කතාබස් කළා. අධ්‍යයනය කළා. උත්සව පැවැත්වූවා. වැඩ කළා. කෑම ඉව්වා. ඇවිද්දා. විවේක ගත්තා. අපට ක්‍රමයෙන් පෙනීගියේ බුද්ධිමය හුවමාරුවක් නිහඬ යාඥාවකට හා භාවනාවක් බවට පත්වූ බවයි.



1994 අන්තර් ආගමික සංවාදය - ජර්මනියේ දී



1994 අන්තර් ආගමික සංවාද - ප්‍රංශයේ



1995 අන්තර් ආගමික සංවාදය -
ජර්මනියේ ටිබෙට් බෞද්ධ මධ්‍යස්ථානයේ දී










1987 අන්තර් ආගමික සංවාදය - පකිස්ථානයේ






1992 අන්තර් ආගමික සංවාදය - ඉන්දුනීසියාවේ

# කොට්ටව ආරණ්‍යයට

මේ අතරතුරේ කාලයේ වස් තුන් මාසය ලන්ඩන් නුවර ගත කරන්නැයි මට ආරාධනාවක් ලැබුණා. ආරාධනාව ලැබුනේ මම ලංකාවෙන් යෑමට සැලසුම් කරමින් සිටිද්දී. මම සිතමින් සිටියේ ශ්‍රී ලංකාව හැර දමා සදහටම ඉවත්ව යායුතු ද කියා. යන්න කලින් මා කොළඹට ළඟාවූ අවස්ථාවේ මුලින්ම හමුවූ ලාංකිකයා වූ හේමකුමාර නානායක්කාරට ආයුබෝවන් කිව යුතුයයි මට සිතුණා. ගාල්ලට නුදුරු උනවටුනෙහිදී මට ඔහු හමුවුනා. අපගේ කථාබහ අතරතුර ගාල්ල-උඩුගම පාරේ යක්කලමුල්ල ආසන්නයේ කොට්ටව නාගආරණ්‍යය නම් වනාන්තර ආවාසයක් ඇති බව ඔහු කීවා. එම ආරණ්‍යවාසී භික්ෂුව ඉතා වයස්ගත බවත් රෝගී ගතියෙන් සිටින බවත් කියා ඔහු මට සාමකාමී දිවියක් ගෙවීමට එය කදිම තැනක් බවද කීවා.

අප එහි ගොස් ආරාමය බැලුවාම එය හුදෙකලා තැනක් බව පෙනී ගියා. මනුස්සයෙකු දකින්නට ලැබෙන්නේ ඉතා කලාතුරකින් වුවත් වඳුරන් නම් ඕනෑතරම් සිටින බවත් මට පෙනීගියා. අවුරුදු 90 ක් වයස්ගත භික්ෂුව 1936 පටන් එහි වාසය කර ඇති බව දැනගත්තා. එහි නැවතීමට මට ආරාධනා කරනු ලැබුවා. එහි පරිසරයට කැමති වූ නිසා නැවතීමට මට සිතුණා.

ආරාමය පිහිටියේ සිංහරාජ අඩවියේ. එයින් මදක් ඈතට වන්නට ගමේ පන්සලක් තිබුණා. ප්‍රදේශයේ දායකයන් හමුවූ මම අපට දානය ලැබෙන ක්‍රමයක් යොදා ගත්තා. අවුරුද්ද පුරාම දානය ලැබෙන හැටියට ලේඛනයක් සකස් කරගත්තා.

කොට්ටව වනගත ආරාමයේ කල්ගත කරද්දී මට සර්පයන් ගැන බියක් ඇතිවුණා. එක් අවස්ථාවක මගේ කුටියට යන අඩිපාරේ විශාල පිඹුරෙකු හමුවුනා මට මතකයි. අඩු ගණනේ අඩි 15 ක්වත් දිග පිඹුරා දැක්ක හැටියේම මම මෙත්තා භාවනාව කළා. සතා කිසිදු අනතුරක් නොකර ඉවත් වුණා.

මට කලින් යොදාගත් අන්දමට ලන්ඩන් යෑමට කාලය ලබාගෙන වස් කාලය එහි ගත කළා.

ඊළඟ වසරේ මාස කීපයක් නෙදර්ලන්තයේ ගත කිරීමට මම තීරණය කළා. යුරෝපීයයන් ටිකෙන් ටික මා දැනහැඳින ගෙන භාවනා පංති පැවැත්වීම සඳහා ආරාධනා කරන්නට පටන්ගත්තා. නිතර පිටරට යෑමට සිදුවූ නිසා කොට්ටව ආරණ්‍යයේ නැවතීමට ගාල්ලට නුදුරු වතුරුවිල ආරාමයෙන් හිමිනමක් ලබා ගැනීමට පිළියෙල කළා.

එංගලන්තයේ සහ කැනඩාවේ ශ්‍රී ලංකා විහාර වලින් ආරාධනා ලැබී ඒ රටවල සංචාරය කළාට පසු 1988 දී ජර්මනියේ බර්ලින් බෞද්ධ විහාරයේ වස් වැසුවා. 1989

මුල්භාගය බෙල්ලන්විල ධම්මරතන හිමියන්ගේ සිංගප්පූරුවේ පන්සලේ ගත කර මගේ වීසා බලපත්‍රයේ කාලය හමාරවූ නිසා ආපසු ලංකාවට පැමුණුනා.

## ගුරු හාමුදුරුවෝ නෙදර්ලන්තයේ

මා නෙදර්ලන්තයේ ගතකළ එක් අවස්ථාවක දවුල්දෙන ඥාණිස්සර ගුරු හාමුදුරුවන් එහි ගෙන්වා ගත්තා. ඒ කාලයේදී තට්ට හිසක් ඇතුව මගේ රට තුළ එහා මෙහා යෑම ඇඟට එතරම් ගුණ නොවූ නිසා මම හිතාමතාම හිස බූ ගෑම මගහැරියා. තට්ට හිසක් ඇති අය එකල හැඳින්වූයේ ස්කින් හෙඩ් (Skin-head) නම් දරුණු මිනිසුන් සමූහයකට. ඔවුන්ගෙන් කෙනෙකු යයි වරදවා තේරුම්ගැනීම වැළැක්වීමට මම අඟලක් තරම් දිගට කෙස් වැවුවා.



නායක හිමියෝ මොස්කව් නුවර ආසියානු සාම බෞද්ධ සංගමයේ සැසි වාරයන්ට සහභාගි වූ නිසා වරක් ඇම්ස්ටර්ඩෑම් නුවර හරහා ගිහින් මගේ දෙමාපියන් සමග නැවතී සිටියා.

උන්වහන්සේ ධර්මදූත මෙහෙවර සඳහා බෙහෙවින් සංචාරය කළා. පාලි සහ බුද්ධ ධර්මය උගන්වන්න උන්වහන්සේ තායිවානයේ වසර කීපයක් ගතකළා. එහිදී උන්වහන්සේ ද භාෂා කීපයක් ඉගෙන ගත්තා.

මම අවුරුද්දකට අට වතාවක් වත් රට ගිය නිසා කොට්ටව නතර කළ භික්ෂුව තමන්ට ඕනෑ විදියට ආරණ්‍යය පාලනය කරන්න පටන්ගත්තා. ඔහු කළ ඇතැම් දේ ගැන මා වැඩි කැමැත්තක් නොදැක්වූ නිසා සට්ටණ ඇති කරගන්නේ නැතුව 1997 දී මම එතැනින් අයින්වුනා.

# අලුත් මෝස්තරයේ ඇඳුමක්

දැන් බටහිර රටවල බුද්ධාගම ගැන අතිවිශාල උනන්දුවක් තිබෙනවා. ඒත් මා නෙදර්ලන්තයෙන් පිටවුණු 1970 දශකයේ මුල් භාගයේ තත්ත්වය ඊට වෙනස්. එකල නෙදර්ලන්තයේ බෞද්ධ සංවිධානයක් තිබුණේ නෑ. කීපදෙනෙකු එක්කාසු වී 'බෞද්ධාගමේ මිතුරන්ගේ පදනම' (Foundation of Friends of Buddhism) නමින් සංගමයක් ඇතිකර ගත්තා. ඔවුහු හමුවුණේ වසරකට දෙවරක් පමණ. මුළු රටෙන්ම 25 දෙනෙක් පමණ එක්වී බුදුදහම ගැන සාකච්ඡා කළා. ඔවුන් තුළ බුදුදහම පිළිබඳ හොඳ දැනුමක් තිබුණා.

වර්තමානයේ නෙදර්ලන්තයේ බෞද්ධ මධ්‍යස්ථාන 250 ක් පමණත් චීන, ටිබැට් හා තායිලන්ත පන්සල් දහයක් පමණත් තිබෙනවා. අලුතෙන්ම කිරිබත්ගොඩ ඥාණානන්ද හිමියන්ගේ 'මහමෙවුනාව' කලින් නෙදර්ලන්තයේ තිබූ වියට්නාම් පන්සලක් ලබාගෙන පන්සලක් පිහිටුවා තිබෙනවා.

ආපසු 1970 කාලය ගැන බලද්දී සිද්ධීන් දෙකක් මගේ මතකයට නැගෙනවා. මම දුම්රියපලේ දී තවත් හිමිනමක් සමග සිටිද්දී කවුදෝ අපි දැකලා 'හරි ක්‍රිෂ්ණා' කියනවා ඇසුණා. "අපි හරි ක්‍රිෂ්ණා නොවෙයි, අපි බෞද්ධ භික්ෂූන්! හරි ලාමා වගෙයි" කියා අපි කීවා. "ඒත් ඒකම නේ" ඔහු කීවා.

තවත් වතාවක 1978 දී කාන්තාවක් අපි ඇඳගෙන සිටි සිවුරු දෙස බලා "ඔය අළුත්ම මෝස්තරයද?" ඇසුවා.

මා පිටරට ගොස් ආපසු ලංකාවට පැමිණ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පාස්පෝට් එක පෙන්වන්න පෝලිමේ සිටිද්දී සිදුවූ දෙයක් මට මතක්වෙනවා. නිලධාරියෙක් මාව දැකලා පෝලිමේ නොසිට එන්නැයි කියා මට අඬගැසුවා. මගේ පිටුපස සිටි විදේශිකයෙක් "මමත් කහපාට තිර රෙද්දක් ගන්න ඕනෑ" යි කියනවා මට ඇසුණා. ඕලන්ද ජාතිකයෙක් වූ ඔහු එසේ කීවේ මගේ සිවුරෙහි පාට නිසා.

බුදුන් කවුදැයි වැඩිදෙනෙකු ඒ කාලයේදී දැනගෙන හිටියේ නෑ. 1978 දී නෙදර්ලන්තයේ ප්‍රදර්ශනයක් බලන්න ගිය වෙලාවේ තායිලන්ත ප්‍රදර්ශන කුටියේ බුදු පිළිමයක් තිබුණා. ශිෂ්‍යයන් පිරිසක් එම කුටියට ගිහින් බලද්දී බුදු පිළිමයට ඇඟිල්ල දික්කළ එක් අයෙක් "අර කවුදැ" යි ගුරුවරයාගෙන් ඇසුවා. "ඒ තමයි බුද්ධ" කියා ගුරුවරයා කීවා. "බුද්ධ කියන්නේ කවුද" ශිෂ්‍යයා ඇසුවා. "ආ! ඒ මේ ඉන්දියානු දෙවියන්ගෙන් එක්කෙනෙක්." ඒ කාලයේ බුද්ධාගම ගැන තිබූ අවබෝධය තමයි ඒ.

දැන් තත්ත්වය එහෙම පිටින්ම වෙනස්. අද වනවිට ඕලන්දයේ ජාතික ගුවන් විදුලිය සහ රූපවාහිනි මාධ්‍යයන් ඔස්සේ බෞද්ධ වැඩසටහන් විසුරුවා හරිනවා. එම වැඩසටහන් සහන පදනමක් මත විසුරුවා හරින්නට රජය ඉඩ සලසා තිබෙනවා.

දැන් නෙදර්ලන්තයේ බෞද්ධ පොතපත ප්‍රකාශයට පත්කරනවා. වෙනත් භාෂාවලින් ලියන ලද පොත් පරිවර්තනය කර තිබෙනවා. ඕලන්ද බසින් ලියූ පොත් තිබෙනවා.

මම බෞද්ධ කටයුතු ගැන උනන්දුවක් දක්වන ජාත්‍යන්තර සංවිධාන කීපයක් සමග සම්බන්ධ වී සිටිනවා. ඉන් එක් ආයතනයක් නම් ඇමෙරිකානුවන් වැඩිපුර සිටින බටහිර බෞද්ධ ගුරුවරුන්ගේ සම්මේලනයයි (Conference of Western Buddhist Teachers). ගිහියන් මෙන්ම භික්ෂූන් හා භික්ෂුණියෝ මෙකී සම්මේලනයන්ට සහභාගි වෙනවා. එවැනි සම්මේලනයක් 1993 දී දලයිලාමා වාසය කරන ඉන්දියාවේ හිමචල් ප්‍රදේශයේ ධරම්ශාලාහි පැවැත්වූවා. ඒ අවස්ථාවේදී උතුරු ඇමෙරිකාවේ බෞද්ධ මධ්‍යස්ථාන 600 ක ලිපිනයන් ඇති පොතක් දලයි ලාමාට තෑගිකෙරුණා. මේ වන විට ඒ ලිපිනයන් ගණන එක් දහස දක්වා ඉහළ ගිහින්.

# හැමතැනම ඉන්න ආනන්ද

1982 දී පැරිසියේ යුනෙස්කෝ කාර්යාලයේ පැවැත්වුණු යුරෝපීය බෞද්ධ සංගමයේ රැස්වීමකට මමත් සහභාගිවුණා. එය සංවිධානය කළේ එහි ලංකා තානාපති මෙන්ම යුරෝපීය බෞද්ධ සංගමයේ අනුශාසක වූ ආචාර්ය ආනන්ද ගුරුගේ. සංගමයේ අරමුණු වුණේ ජාත්‍යන්තර වශයෙන් තොරතුරු හුවමාරු කරගැනීම, යුරෝපීය බෞද්ධයන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීම, සමාජයීය කටයුතුවලට හා බෞද්ධ වටිනාකම්වලින් යුත් අදහස්වලට අනුබල දීම. යුරෝපයේත් මුලු ලෝකය පුරාමත් බෞද්ධ හඬ විශාල වශයෙන් ප්‍රචාරය කිරීමත් එයින් බලාපොරොත්තු වුණා.

මම තායිවානයේත් අමෙරිකාවේ ලොස් ඇන්ජලිස්වල ප්‍රධාන කාර්යාල තිබෙන (Buddha's Light) බුදුන්ගේ ආලෝකය' ජාත්‍යන්තර සංවිධානයේ සාමාජිකයෙක්. 1949 දී චීනයේ සිට තායිවානයට පැමිණුනු 'මාස්ටර්' සින්ග් යුන් (Master Hsing Yun) පිහිටවූ මෙය සමාජයට හිතකර වන සේවාවන්ට හා ක්‍රියාවන්ට සම්බන්ධ මානුෂීය බුදුදහම දියුණු කරනවා වගේම වෙනත් ආගම් හා නිකායවල සාමාජිකයන් හා මිත්‍ර සම්බන්ධතා පවත්වාගෙන යනවා. ඔවුන්ගේ එක් ව්‍යාපෘතියක් වුණේ අප්‍රිකානු පිරිමි දරුවන් (බහුතරය කොංගෝවෙන්) බුද්ධාගමට හරවා ඔවුන් තායිවානයට කැඳවාගෙන ගිහින් චීන බස උගන්වා බුදුදහමෙහි පුහුණු කිරීම. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ආපසු අප්‍රිකාවට ගියාට පස්සේ සිවුරු ගලවා දමා චීනයත් තායිවානයත් සමග ව්‍යාපාර කරන්නට පටන්ගත්තා.

දේශනා සහ භාවනා වැඩසටහන් පැවැත්වීමටත්, ජාත්‍යන්තර සම්මේලනයන්ට සහභාගි වීමටත් මට නිතර ආරාධනා ලැබෙනවා. ඒ නිසා මම 'සංචාරක හිමිනමක්' වූ නිසා මට 'පියාසර කරන ඕලන්ද හාමුදුරුවෝ' කියා නමක් පටබැඳුණා. ආචාර්ය ආනන්ද ගුරුගේ ද යුරෝපයේ බෞද්ධ සම්මේලනයන්ට සහභාගි වෙමින් එහා මෙහා යද්දී බලාපොරොත්තු නොවන තැන්වලදී මට අහම්බෙන් මුණගැහෙනවා. 'ඕලන්දේ ආනන්ද' කියනවාට වඩා 'ඕල්ඕවර් ආනන්ද' (හැමතැනම ඉන්න ආනන්ද) කියා මගේ නම වෙනස් කරන්න හොඳයි කියා ඔහු මට කීවා.

1977 අප්‍රේල් මාසයේ මගේ පියා මියගියාට පස්සේ මම මාස අටක් පමණ නෙදර්ලන්තයේ නැවතී සිටියා. ආපසු ලංකාවට ගිහින් කොට්ටව ආරණ්‍යයේ නැවතී සිටීමට මා කල්පනාකළා. ඒත් අන්තිමේදී මම පැවිදිවූ පාගොඩ විහාරයටම ආපසු ආවා. ශ්‍රියාවතී ගොන්සාල්කෝරාලේ නම් වයසක කාන්තාවක් මගේ ගුරුවරයා වූ ඥාණිස්සර හිමියන්ට පාගොඩ පළමුවන හරස් වීදියේ ගෙයක් සහිත අක්කර බාගයක් තෑගි කළ බව දැනගන්නට ලැබුණා. මම ලංකාවට එද්දී නායක හිමියන් සිටියේ ඔස්ට්‍රේලියාවේ. අසනීප වූ හිමිවරුන් රෝහලින් පිටවුනාම කීප දවසක් නැවතී සිටීමට පුලුවන් ස්ථානයක් පවත්වා ගන්නවාට කැමතියි කියා ඉඩම තෑගි කළ කාන්තාව මා සමඟ කීවා. මට එය භාරව කටයුතු කළ හැකිදැයි ඇහුවාම මම කැමතිවුනේ නෑ. මම කැමති භාවනා මධ්‍යස්ථානයකට පමණක් බව කීවා. රට ගිහින් ආපසු පැමිණියාම නායක හිමියෝත් මගේ අදහසට එකඟ වුණා.

1998 මුල් භාගයේ ඒ ඉඩමේ තිබුණු ගෙදර මම පදිංචි වුණා. එය අදත් මගේ නවාතැනයි.



භාවනා මධ්‍යස්ථානයක් වගේ පවත්වා ගෙන යන අතරම රෝගී හාමුදුරුවරු රෝහලේ නැවතී ආවට පස්සේ හොඳට සනීපවෙන කල් එතන නැවතී ඉන්නත් ඉඩකඩ සලසා තිබෙනවා.

මුලින් එතන 'භික්ෂු විවේක ආශ්‍රමය සහ භාවනා මධ්‍යස්ථානය' කියා නම්කරලා පස්සේ මම 'පාගොඩ භාවනා මධ්‍යස්ථානය' කියා නම වෙනස් කළා.

## සිංහල ඉගෙන ගැනීම

මා පැවිදිවූ මුල් දවසේ සිටම සිංහල ඉගෙන ගන්නට කැමැත්ත දැක්වූවා. ඒ අවට ප්‍රදේශයේ ජනයා සමග කතාබහ කිරීමට. සිංහල බෞද්ධයන් කොතරම් භක්තිවන්ත ද කියාත් ඔවුන් දානය පිළිගැන්වීමට පුල පුලා සිටින බවත් දැනගැනීමට මට වැඩි කලක් ගතවූයේ නෑ. ඔවුන් මිරිස් හා තුනපහ යහමින් දමා නියම සිංහල පිළිවෙලට රසවත් කෑම වර්ග රැසක් පිළියෙල කරනවා. ඒ විතරක් නොවෙයි - ඒ හැම එකක්ම භික්ෂූන් විසින් වළඳනවා දැකීමටත් ඒ අය බලාපොරොත්තු වෙනවා.

ඔවුන් පූජා කරන ප්‍රමාණය හුඟක් වැඩිබව මට ඉක්මනින්ම පෙනී ගියා. උවමනාවට වඩා බෙදීම වළකන්න මම මුලදී නිහතමානීව 'ඒ ඇති' යයි කීවත් වැඩිදෙනෙක් මට කන් දුන්නේ නෑ.

අනෙක් අයට ඇහුන්කන් දීමෙන් හා ඔවුන් සමග කතාබහ කිරීමෙන් මම සිංහල වචන කීපයක් අහුලාගත්තා. මහාචාර්ය ජේ.බී. දිසානායකගේ පොත් වගේම තවත් සරල පොත් කිහිපයක්ද බලා මම සිංහල ඉගෙන ගත්තා. මගේ ගුරුවර නායක හාමුදුරුවෝත් මට හෝඩියේ අකුරු කියාදුන්නා. සිංහලෙන් කතා කිරීමට වගේම බණ කීමටත් මම උනන්දුවුනා. රටක ජනතාවගෙන් වැඩි කොටසක් කථා කරන භාෂාව දැනගත්තාම ඒ රටේ ජීවත් වීම වඩා පහසුයි. දායකයන්ටත් පහසුයි.

ලංකාවේ කෙනෙකු පැවිදිවුනාම ඔහුගේ නමට මුලින් ඔහු උපන් ස්ථානයේ නම සඳහන් කිරීමේ සිරිත මාත් අනුගමනය කිරීම ගැන මම සතුටු වෙනවා. මහජනයාට ද 'ඕලන්දේ ආනන්ද' කියා කීම පහසුයි. එසේ නොවුනා නම් 'ආනන්ද' කියන නම ඉතා ජනප්‍රිය භික්ෂු නාමයක් නිසා මා හඳුන්වා ගැනීමේදීත් මට කථා කිරීමේදීත් ප්‍රශ්ණයක් වෙන්න ඉඩ තිබුණා.

පාගොඩ පළමුවන හරස් වීදියේ කටයුතු එකලසක් වී ගොඩනැගිල්ලක් ද හැදීමෙන් පස්සේ මගේ ගුරු හාමුදුරුවෝත් එහි වාසයට පැමිණියා. 2002 දී මම ඉරිදා සවස් වරුවේ සහ අඟහරුවාදා හැන්දෑවේ භාවනා වැඩසටහනක් ආරම්භ කළා. ජාත්‍යන්තර පාසල්වලට යන දරුවන්ගේ යහපත ගැන හිතා ඉංග්‍රීසියෙන් දහම් පාසලක් පටන් ගත්තා. භාවනා පන්තිවලට බොහෝ දෙනෙකු සහභාගි වුනා. ජනප්‍රිය පන්සල්වල වගේම නගරයේ බෞද්ධ ආයතනවල භාවනා පන්ති පවත්වා තව බොහෝ දෙනෙක් භාවනාවට උනන්දු කරවන්න පුලුවන් බව මට තේරුණා. 2004 දී සතිපතා පංතියක් ගංගාරාමයේ පටන් ගත්තා. අවුරුදු හතරකට පස්සේ තිඹිරිගස්යායේ මායා පෙදෙසේ යමුනා බෞද්ධ මධ්‍යස්ථානයේ තවත් පන්තියක් පටන්ගත්තා. 2011 දී ඒ

භාවනා පන්තිය තුන්මුල්ලේ සම්බුද්ධ ජයන්ති බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයට ගෙන ගිහින් අද දක්වා පැවැත්වෙනවා. විශේෂ පෝය වැඩසටහන් පාගොඩ භාවනා මධ්‍යස්ථානයේ පවත්වනවා.

මම සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ගුවන් විදුලි වැඩසටහන් පවත්වන ගමන් බෞද්ධයා නාලිකාවේත් බණ කියනවා. සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් සමූහ සාකච්ඡාවලට සහභාගි වෙනවා.

බම්බලපිටියේ ලොරීස් පාරේ මෛත්‍රී ශාලාව 1920 දී කළේ බුදුදහමට ලැදි 'Servants of the Buddha` සංගමයෙන්. එහි සාමාජිකයෝ හැම ඉරිදා දිනයකම එතෙන්ට රැස්වෙනවා. මෙහි කටයුතු ඉංග්‍රීසියෙන් කෙරෙන අතර මාසයේ හැම තුන්වන සෙනසුරාදාවකම මම එහි බණ කියනවා.

මෙම ගොඩනැගිල්ල, පල්ලියකට බෙහෙවින් සමාන නිසා 'මෛත්‍රී ශාලාව' කියා නම ලැබුනේ කොහොමදැයි හුඟදෙනෙකුට ප්‍රහේලිකාවක්. 'මෛත්‍රී' යන්න අවශ්‍යයෙන්ම බුදුදහමේ දයා කරුණාව දැක්වෙන වචනයක්. මේ ගොඩනැගිල්ලෙන් පෙන්නුම් කරන්නේ ලංකාවට 1948 දී නිදහස ලැබීමට කලින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව තිබුණු කාලයේ පල්ලියේ ගොඩනැගිලි සම්ප්‍රදාය අනුගමනය කළ ආකාරයයි.

# සතියෙන් සිටීම

දැන් ලෝකය පුරාම භාවනාව ගැන ඇත්තේ ලොකු උනන්දුවක්. බොහෝ දෙනෙකුට බුද්ධාගම කියන්නේ භාවනාව. නොයෙකුත් වර්ගවල භාවනා තිබුණත් බුද්ධාගම ගැන උනන්දු වන කෙනෙකුට සතියෙන් සිටීම හොඳ ආරම්භයක්.

සතියෙන් සිටීම කියන්නේ තමා මේ මෙහොතේ එකම අරමුණක සිටීම. එසේ සිටීමෙන් එක් දෙයක් ගැන මුළුමනින්ම හිත තබාගැනීමට පුලුවන් කියා ලොකු බලාපොරොත්තු ඇතිකරගන්න නරකයි.

එය සරල ව්‍යායාමයක් බවට පත් කිරීමට මම උත්සාහකරන්නම්. ඔබ වාඩිවී පළමුව වර්තමාන මොහොත ගැන සිහියෙන් සිටින්න - ඒ කියන්නේ එක්තරා තැනක, එක්තරා ආකාරයකට වාඩිවී සිටින්න. ඊළඟට හිසේ ඉඳන් දෙපතුල දක්වාත් නැවත දෙපතුල ඉඳන් හිස දක්වාත් හිතින් බලන්න. එතකොට හිත අතීතයට නැත්නම් අනාගතයට යෑම වැළැක්වෙනවා. හිත වර්තමාන මොහොතේ පමණක් තියෙන්න ඕනෑ. ඒ මොහොතේ එක් අරමුණකට හිත යොමු කරන්න. එසේ කරන්නේ ඔබ යම් තැනක යම්කිසි ආකාරයකට සිටින බව ශරීරයට දැනීමට. ඊළඟට ඔබට හොඳට හුරු පුරුදු දෙයක් ගැන හිත යොමු කරන්න. සරලම වූ දේ තමයි ඔබගේ හුස්ම දෙස බලා සිටීම - හුස්ම ඇතුළට ගැනීම හා පිට කිරීම. ඒ තමා 'ආනාපානසති' භාවනාව - හුස්ම ගැන සිහියෙන් සිටීම. හිත පිහිටුවාගන්නා අරමුණ හුස්ම. පුලුවන්තරම් දුරට හිත එහෙ මෙහෙ යන්න පටන් ගත්තාම හිත ආපසු ගන්න. එසේම ඔබේ හිත ගිය අරමුණු ගැන ද අවබෝධයෙන් සිටින්න. ඒ දේවල් එසේ නොවිය යුතු යයි කියා හිතන්න එපා - නමුත් ඒවාට ඇලෙන්න එපා - ඒවාට යන්න හරින්න.

නොකඩවා පුහුණුකිරීමෙන් හිත එකම අරමුණක තබා ගන්න පහසු වෙනවා. ඔබේ හිත එක අරමුණක නොසිටින්නේ නම් ඒ ඔබේ භාවනාව අසාර්ථක වීමක් නොවෙයි. ඉන් අදහස් කරන්නේ අනෙක් අරමුණු ගැනද අවබෝධයෙන් ඉඳීම හා අපගේ ශරීරයට සම්බන්ධ අනෙක් අරමුණු ගැනද සමසිතින් බැලීම.

ආනාපානසති භාවනාව පටන්ගන්න කලින් තැන්පත් වී ඊළඟට සියළු සත්වයන්ට මෛත්‍රී කරුණාව පැතිරවීමෙන් ආනාපාන භාවනාවට පරිසරය සකස් කරගැනීම වඩාත් හොඳයි. මෛත්‍රී කරුණාව පතුරුවන්නේ තමා ද ඇතුලත්ව මනුෂ්‍ය, සත්ව, පෙනෙන නොපෙනෙන හැමදෙනාටම. ඔබේ හදවතින් මෛත්‍රී කරුණාව පතුරුවා හැරීමෙන් පස්සේ ඔබගේ හුස්ම ගැන හිත යොමු කරන්න ඔබේ හිත තැන්පත්ව පවතිනවා.

ඊට කියන්නේ සමථ භාවනාව, ශාන්ත භාවනාව ලෙසයි මම සලකන්නේ. මෙය විපස්සනා භාවනාව (insight meditation) කිරීම සඳහා අවශ්‍ය පෙරහුරුවක්.

සතිය (සිහිය) පුරුදු කිරීමෙන් ඇති දෙය නියම ආකාරයෙන් දැකීමට පුළුවන්. බුදුන් වහන්සේ 'යථාභූතඥානදස්සන' - ඇතිදේ ඇති සැටියෙන් දැකීම කියා සඳහන් කරන්නේ මෙයයි. අවිද්‍යාව හා මෝහය ක්‍රමයෙන් උදුරා දැමීමටත් තණ්හාව හා ක්‍රෝධය වැනි දුකට හේතුවන කරුණු ඉක්මවීමටත් මෙය උපකාර වෙනවා.

මගේ භාවනා වැඩසටහන්වලට නිතර පැමිණෙන අයට මම ඒ අන්දමට නොකඩවා භාවනාව පුරුදු කරනවා.

# එක ආත්මයක ටිබැටයේ

මම 1984 නොවැම්බර් 23 වනදා සත්‍ය සායිබාබාගේ 59 වන උපන්දින උත්සවයට ගිය වෙලාවේදී මට ඉන්දියානු ගුවන් විදුලි සේවයේ කළමනාකරුවෙකු මුණගැහුවුණා. අපි හමුවුණේ බැංගලෝර් නුවර බස් නැවතුම්පලේ ආපන ශාලාවකදී. නමින් පිල්ලේ වූ ඔහු මා යන්නේ කොහාටදැයි ඇසුවා. මා මයිසෝරයට යන බව කීවාම එහි සරසවියේ පිහිනුම් තටාකයට යාබදව හොඳ බෞද්ධ මධ්‍යස්ථානයක් ඇතිබව ඔහු කීවා.

ඉන්දියාවේ කර්නාටක ප්‍රාන්තයේ මයිසෝර්හි දී ජම්මු කාශ්මීර ප්‍රාන්තයට අයත් ලඩාක් ප්‍රදේශයේ සිසුන් පිරිසක් හමුවුණා. ඔවුන් නැවතී සිටියේ බැංගලෝරයේ මහාබෝධි මධ්‍යස්ථානය භාර ආචාර්ය බුද්ධරක්ඛිත හිමියන්ගේ සිසුවෙකු වූ සංඝසේන හිමියන්ගේ නායකත්වය යටතේ. මට එහිදී බරපතල හෙම්බිරිස්සාවක් හැදුණු නිසා ගමන් බිමන් අඩුකරන්නට වුණා. තරුණයන් මට උණු වතුරෙන් නෑමට සලස්වා බෙහෙත් ලබාදී හොඳට මාව බලාගත්තා.

ඒ ගමනට පස්සේ මම දහ වතාවක් එහි ගියා. මුලින්ම ගියේ 1991 ජූනි මාසයේදී මහාබෝධි ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවයට. පසුව හැම අවුරුද්දකම ගොස් භාවනා පන්ති පැවැත්වූවා. ඒ වැඩියෙන්ම විදේශික සංචාරකයින්ට.

1991 දී බැංගලෝර්හි මහාබෝධි මධ්‍යස්ථානයට ගිය අවස්ථාවේදී මයිසෝර් නුවරට කිට්ටු ආරාමයක සිටි අනාවැකි කීමට සුප්‍රකට කාන්තාවක් බැලීමට ගියා. මගේ අතීත ජීවිත ගැන දැනගන්න පුලුවන් දැයි ඇහුවාම මම ටිබැටයේ **ක්හැම්** ප්‍රාන්තයේදී අතේ නෙළුම් මලක් තබාගෙන ස්ථූපයක් වටා යනවාත්, 1933 දී එහිදී මා මියයනවාත් ඈ දකින බව කීවා.

මා ටිබැට් ජාතික මිතුරෙකු සමග දෙවන වතාවට ටිබැටයට ගිය අවස්ථාවේ අපි චීනයේ සිකුවැන් ප්‍රාන්තයේ **චෙන්ග්ඩු** (Chengdu) සිට **ක්හාම්** දක්වා ගියා.

**ලිතැන්ග්හි** නතර වුනාම මීට කලින් එහි පැමිණ ඇතිබවක් මට හැගුණා. කඳු මුදුනක තිබූ විහාරයක් දැක අපට එහි යෑමට සිතුණා. යාලුවා පාර දන්නේ නැති බව හැඟෙව්වාම "මම දන්නවා යන පාර" කියා මම ඔහුට පාර පෙන්වූවා. එය පස්වැනි දලයිලාමා කළ එකක් බව අපට පෙනී ගියා. අපි ඊළඟට නැවතුන '**කාස්**' හි පන්සල්, ගම්, අතහැර දමූ ආවාස වැනි ස්ථානවලට ගියාම මට අමුතුම ආකාරයේ හැඟීම් ඇතිවුණා. මගේ දෑස කඳුලින් තෙත්වුනා.

මට මග පෙන්වූ හිමියන් ඉන්න ඇම්ඩෝ ප්‍රාන්තයේ ඔහුගේ ආරාමයට ගියා. එහි භික්ෂූන් හාර දහසක් සිටියා. බෞද්ධ ඉගැන්වීම්, සූත්‍ර, විනය, තන්ත්‍ර, ජ්‍යොතිෂ විද්‍යාව හා දේශීය වෛද්‍ය ක්‍රම උගන්වන්න පහසුකම් එහි තිබුණා.

මා වියට්නාම් මිතුරෙකුද සමග හාපුරා කියා ටිබෙටයට ගියේ අහස්යානයෙන්. චීනයේ හා මොන්ගෝලියාවේ සංචාරය කරමින් සිටි අපට ටිබෙටයේ **ලාසා** ඒ අවට නැරඹීමට තිබුනේ දවස් හතරක්. එය විශ්මයජනක අත්දැකීමක් වුණා.

මොන්ගෝලියාවේ **ක්හම්බෝ** ලාමා 1970 ගණන්වල ශ්‍රී ලංකාවේ ඉගෙනගත් කෙනෙක්. අපි මිත්‍රත්වයක් ඇතිකරගත්තේ ජාත්‍යන්තර රැස්වීම්වකදී මුණගැසීමෙන් පසුව. වරක් ඔහු මොන්ගෝලියාවට එන්නට මට ආරාධනා කළා. **බීජිං** නගරයට ඇවිත් මොන්ගෝලියාවට ඒම පහසු බව ඔහු කීවා. මම කීපවරක් **බීජිං** වලට ගිහින් තිබුණත් ඒ බව දැනසිටියේ නෑ.

2006 දී මගේ වියට්නාම මිත්‍රයා වූ **ක්වැන්ග් චැන්හ්** සමග මම මොන්ගෝලියාවේ අගනුවර වන **යුලැන් බාටර්** හා **ක්හැම්බෝ ලාමා ඩැම්බයෙව්** බලන්නට ගියා. ඔහුගේ ආරාමයේ දී ඔහු අප මහත් ඉහළින් පිළිගත්තා. ඊළඟ අවුරුද්දේ මා තනිවම ගිහින් **යුලැන් බාටර්** අවට බොහෝ දේ දැක බලාගත්තා. ස්ටාලින් යුගයේ පටන් කොමියුනිස්ට්වාදය අසාර්ථක වූ 1990 දක්වා මොන්ගෝලියාව රුසියානු ආධිපත්‍යය යටතේ තිබී ඉන්පසු ආගමික නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බවට පත්වූවා.

නිතරම මා ගිය, හිමාලය වටේ වූ අනෙකුත් රාජ්‍යයන් වූයේ නේපාලය, සික්කිම්, ඩාර්ජලිං හා **කාලිම්පොන්ග්**. ඒවා බෙහෙවින් සිත් ඇදගන්නා තැන් වගේම මිශ්‍ර සංස්කෘතීන්, භාෂා, විවිධ ආකාරයේ ටිබැට් බුද්ධාගම් මෙන්ම ථේරවාද බුදුසමයද පැවතුණු රටවල්. ඒ වගේම විවිධ ගෝත්‍ර වල ජනයා ද සිටින රටවල්.

1999 දෙසැම්බර් මස අවසන් සතියේත් ඊළඟ සතියේත් ථේරවාද ෂර්පා හිමිනමක් යටතේ මම ඩාජිලිංහිදී භාවනා වැඩසටහනක් පැවැත්වූවා. ඔහුගේ නම

ධම්මධීරෝ. නේපාල, ෂර්පා, බෙංගාලි හා ගුරුන්ග් ජාතිකයින් සමග එක් ආජන්ටිනා කාන්තාවක් ද ඊට සහභාගිවූවා. අපි හැමෝම සලගගුරා ථූපය බැලීමට ගියා. ඒ ලාමා කෙනෙකු වූ කාලු රිම්පෝක් (1905-89) ගේ දේහය ආරක්ෂා කර තිබෙන තැන. බටහිර වැසියන්ට ධර්මය මුලින්ම කියාදුන් හිමිවරුන් අතර උන්වහන්සේ එක් ටිබැට් හිමිනමක්. ශ්‍රේෂ්ඨ තායි සිතු රිම්පෝ තම සිව්දින වැඩසටහනක් හමාර කරමින් ඊට දායක වූ දහසක් දෙනාට ආශිර්වාද කරමින් සිටියා.

## භූතානයේදී

2008 දී මට භූතානයට යන්නට හිතුණා. ඕලන්දයේ ඔටුන්න හිමි රජකුමරු භූතානයට ගිය ගමන ගැන රූපවාහිනී වාර්තා චිත්‍රපටයක් දැක 1970 ගණන්වලදී පාගොඩ විහාරයට පැමිණි භූතාන භික්ෂු පිරිසක් ගැන මට මතක්වුණා. එ අතරතුරේදී කොහේදෝ සිටි කාන්තාවක් මට භූතානයට යන්න කටයුතු පිළියෙල කරන්න පුලුවන් කියා ඊමේල් පණිවුඩයක් මගින් දැන්වූවා. ශ්‍රී ලංකාවේ ඉගෙන ගත් **දාෂෝ සන්හෙයි වොන්ග්චුක්** (Dasho Sangye Wangchuck) ද මට උදව් කළ නිසා මම භූතානයට ගියා.

මගේ සංචාරය නිමවෙද්දී මගේ වාසනාවට එරට රජුගේ පුත්‍රයා වූ **ජිග්මි කේසර් නම්ගියල් වොන්ග්චුක්ගේ** (Jigme Khesar Namgyel Wangchuck) අභිෂේක මංගල්‍යය පැවැත්වෙන බව දැනගන්න ලැබුණා. එතරම් රූප සම්පන්න පිරිසක් එතරම් අලංකාර ඇඳුමින් සැරසී සිටිනවා මීට කලින් මා කවදාවත් දැක තිබුණේ නෑ. ඔවුන් ඇඳ සිටියේ අත් යන්ත්‍ර වලින් වියූ රෙදි. අහිතකර විෂවායු පිට නොකරන පළමුවන රට ද භූතානයයි. ඉතාමත් ගතානුගතික රටක් වුවත් දිගු කාලයක් තුළ යහපත් ජීවන තත්වයක් පවත්වාගෙන යෑම අතින් භූතානය ඉන්නේ අනිත් රටවලට වඩා ඉදිරියෙන්.

ආරාම වලට ගියාම මාව ඉමහත් උණුසුමකින් පිළිගනු ලැබූ නිසා අමුත්තෙකු යයි හැඟීමක් මට ඇතිවුණේ නෑ.

අඩි 2700 ක් උස සුප්‍රසිද්ධ **ටැක්සැන්ග් ගෝපා** හෙවත් 'ටයිගර්ස් නෙස්ට්' නම් ස්ථානය දක්වා වූ ඉතාමත් සීග්‍ර බෑවුමක් සහිත කන්ද නැගීමේදී හා බැහීමේදී මම විශ්මයෙන් විශ්මයට පත්වූවා. මගේ දෑස කඳුලින් තෙත්වුණා. මා එක් භවයක් නැත්නම් දෙකක් භූතානයේ ජීවත්ව ඉන්න ඇතැයි මට සිතුණේ මා දැකපු වෙස් මුහුණක් නෙරාගිය ඇස් ගෙඩිවලින් මා දෙස එක එල්ලේ බලා සිටිනවා දැක්ක නිසා. නෙදර්ලන්තයේ පාසල් දරුවෙකු හැටියට මම නිතර ඒ වගේ චිත්‍රයක් ඇන්දා මට

මතකයි. භූතානයේ, ටිබැටයේ හා චීනයේ ආරාමවල හා මාලිගාවල තිබූ රැලි සහිත සැරසිලි ද මා ඇන්දා මතකයි.

තායිවාන බෞද්ධයන් සමග 1989 දී මම චීනයේ බෞද්ධ ස්ථාන රැසක් දැක බලාගත්තා. පසුකාලයේ, අඩු වශයෙන් හත් වාරයක් සමන්තභද්‍ර බෝධිසත්වයන් සිටින ස්ථානයැයි කියන **සිකුවාන්** ප්‍රාන්තයේ **අර් මී ශාන්** කන්ද නැග්ගා. මීටර් 71 ක උස බුදු පිළිමයක් ගලෙහි කොට ඇති **ලේ ශාන් ටා ෆෝ** නොහොත් සතුටු කන්දටත් මංජු ශ්‍රී බෝධිසත්වයන්ගේ වාසය වූ ආරාම 108 ක් ඇති '**වූ තායි ෂැන්**' නම් විශාල ජාතික උද්‍යානයටත් ගියා.

## යුරෝපයේ භාවනා පන්ති

ජර්මනියේදී අලගාවුහි 'බුද්ධ හවුස්' සමග මගේ විශේෂ සම්බන්ධයක් තිබුණා. එය ඛේමා තෙරුණිය 1989 දී සෑදූ විහාරයක්. ඇය 1997 දී මියගිය පසුව විහාරය ඇගේ සිසු නයනබෝධි හිමියන් විසින් පවත්වාගෙන යනු ලබනවා. නයනබෝධි හිමියන්ගේ උපසම්පදා උත්සවයට උදව් කිරීමට 1997 ජුනි මාසයේ මම එහි ගියා. මට හොඳින් ජර්මානු බස පුලුවන් නිසාත් මා උගන්වන ක්‍රමය ඇයගේ ක්‍රමයට හුඟක් සමාන වූ නිසාත් මට එහි එන්න කියා ඛේමා තෙරණිය කීවා. 1997-2010 දක්වා එක් සතිය බැගින් මම බුද්ධ හවුස්හි භාවනා පාඨමාලා පැවැත්වුවා. විහාරය තිබුණේ අලංකාර ගම්බද පරිසරයක. එළදෙනුන්ගේ ගෙජ්ජි හඬ වටාපිටාවේ ගොවිපලවල් පැත්තෙන් ඇහෙනවා.

ඒ ගමනේදීම මම බුද්ධ හවුස් පාඨමාලාව රයින් නදිය ආසන්නයේ අයිෆල් කන්දේ ගිනිකඳු නිසා සෑදුණු විලක් අසබඩ බොන් නගරයට දකුණෙන් පිහිටි **නිකනිච්** (Nickenich) හි **වල්ඩ් හවුස්හි** පැවැත්වූවා. ලංකාවේ ගොඩ්වින් සමරරත්න එහි ඉගැන්වූ අවදියේ 1995 දී මම මේ ලස්සන තැනට ගියා.

1987දිත් 1988දිත් වස් තුන්මස ගත කරද්දී මම බර්ලින් බෞද්ධ විහාරයේ (Das Buddhistische Haus) ඉගැන්වූවා. එය 1924 දී ආචාර්ය පෝල් ඩාල්කේ (Dahlke) ඉදිකළ යුරෝපයේ පැරණිතම බෞද්ධ විහාරයයි.

2000 ප්‍රදර්ශනය පැවති කාලයේ ජර්මානු මිත්‍ර හයින් රොයිගර් සමග මම වියට්නාම් විහාරයේ ඉගැන්වූවා.

ප්‍රංශයේ ලස්සන බොගෝගන් ප්‍රදේශය ඇත්තේ ජිනීවා නගරයට බටහිර දෙසින්. එහි කඳු අතර අපූරු පරිසරයක ටිබැට් බෞද්ධ මධ්‍යස්ථානයක් තිබෙනවා.

**කර්මා ලින්ග්** නම් ඒ මධ්‍යස්ථානය සාදා ඇත්තේ ලාමා ඩෙනිස් විසින්. එය කලින් පැරණි කතෝලික දේවස්ථානයක්. නියම ටිබැට් බෞද්ධ ස්ථූපයක් එකතු කරන එතැන වෙනස් කරුණා. දලයි ලාමා විසින් ආශිර්වාද කරනු ලැබූ එහිදී මම දේශනා කීපයක් පැවැත්වුවා.

පිටරට වාසය කරන ලංකා බෞද්ධයන් ආරාධනා කර මම ඇමෙරිකාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, එංගලන්තය හා ප්‍රංශය හා වෙනත් රටවල් කීපයක බෞද්ධ ආරාමයන්ට ගිහින් තිබෙනවා.

1989 දෙසැම්බරයේ දකුණු අප්‍රිකාවෙන් ආරාධනාවක් ලබා මම තුන් මාසයක් එහෙ ගතකළා. කේප්ටවුමට වැඩි දුරක් නොවූ සමර්සෙට් වෙස්ට්හි අප භාවනා කරද්දී නෙල්සන් මැන්ඩෙලා නිදහස ලබා සිරගෙයින් පිටතට ආවා. **ඉක්සොපෝහි** (Ixopo) බෞද්ධ භාවනා සමිතියේ ආරාධනයකින් දකුණු අප්‍රිකාවේ වෙනත් නගරවලටත් යන්න අවස්ථාව ලැබුණා. සිම්බාබ්වේ කරා යෑමට ගමනක් පිළියෙල කරදුන් නිසා සුදු ජාතිකයෙකුට අයත් ගොවිපලක ඉතා සාර්ථක අන්තර්ජාතික භාවනා වැඩසටහනක් කළා. හරාරේ නුවර ඕලන්ද තානාපති කාර්යාලයේ ලේකම් වූ මගේ මිත්‍ර පීටර් ෆ්ලික්ද හමුවුණා. ඔහු 1979-85 කාලයේ ශ්‍රී ලංකාවේ සිටියා.

## පෙරදිග රටවල

මා ඕස්ට්‍රේලියාවට යෑමේදීත් ආපසු ඒමේදීත් ඉන්දුනීසියාවේ බාලි දූපතට යනවා. දෙවියන්ගේ දූපත නමින් හැඳින්වෙන මෙහි 90% ක් හින්දු සහ 10%ක්. ඒ ගමන්වලදී නැවතී සිටියේ බෞද්ධ පන්සල්වල. ලෝකයේ ඉතා විශාල චෛත්‍යයේ මධ්‍යම ජාවාහි පිහිටි, ක්‍රි.ව. 9-10 කාලයට අයත් බෝරෝබුදූර් චෛත්‍යයයි. මෙහිදී මම වෙසක් උත්සව කීපයකට සම්බන්ධවුනා. එය ඉන්දුනීසියාව පුරා ජනයාගෙන් පනස්දහසක් පමණ එකවර රැස්වෙන තැනක්. 1993දීත් 1995 දීත් වෙසක් ආසන්නයේ මා 'බෝරෝබුදූර් පාමුලදී' යනුවෙන් භාවනා වැඩමුළු දෙකක් පැවැත්වූවා. ජාතීන් කීපයකින් විසි දෙනෙක් පමණ හැම වතාවේම සහභාගිවුණා. අපි හිමිදිරි පාන්දර 4.30 සිට ඇවිද ගොස් උදේ 5.00 ට බෝරෝබුදූර් වෙත ළඟාවුණා. ඒ අනෙක් සංචාරකයන් පැමිණීමට පැයකට කලින්. ඒ නිසා අපට භාවනා කිරීමට මුළු භූමියේම ඉඩ තිබුණා. අප භාවනා කරන අතරතුර 1548 සිට ලොව ප්‍රබලතම ක්‍රියාකාරී ගිනිකන්ද වූ මෙරාපි පර්වතය පිටුපසින් හිරු ක්‍රම ක්‍රමයෙන් නැගී ආ සැටි පුදුම ආශ්චර්යක්!

මගේ මහායාන/ බුද්ධයාන ආගමික සම්බන්ධකම් නිසා ඊට පසු අවස්ථා ගණනාවකදී මම ඉන්දුනීසියාවට ගියා.

කඨින පිංකම් සතියේ ජකර්තාහි ඒකායන විහාරයේ මම ධර්ම දේශනාවක් පැවැත්වූවා. උතුරු සුමාත්‍රාවේ මේඩාන් සමීපයේ විශාල මහායාන පන්සලක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වුණා. ඒ සමගම මම සාමාජිකයෙක් වූ ලෝක බෞද්ධ සංඝ සභාවේ (World Buddhist Sangha Council) රැස්වීමකට සහභාගිවුණා.

තායිවාන් සමග මගේ සම්බන්ධය පටන්ගත්තේ 1987 දී. තායිපේහි චීන බෞද්ධ සංගමයේ සභාපති වූ ගරුතර මින්ග් ක්වැන්ග් සමග ඇති සම්බන්ධය ඇතිවූයේත් ඒ දවස්වලම. ඔහුගේ පන්සලේ සිට බෞද්ධ ළමයින්ගේ සරත් කාලයේ කඳවුරුවලට සම්බන්ධ වීමට ඔහු මට ඉඩ ලබාදුන්නා. මම මුලින්ම චීන භාෂාව ඉගෙනගත්තේ එහිදී. පසුව මම කායෝ සියුන්ග් ෆෝ ගුවැන්ග් ෂැන් විහාරයේදීත් තායිවාන රට වටේ සහ ලෝකයේ අනෙක් තැන්වලත් විහාර එක්ක සම්බන්ධකම් පැවැත්වූවා. චීන බස කථා නොකරන අයගේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වශයෙන් ද ජාත්‍යන්තර අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ කෙනෙකු වශයෙන් ද මා පත් කරගනු ලැබුවා. වාසනාවකට වගේ මේ තනතුරුවල අදාල කටයුතුවුණේ රැස්වීම්වලට සහභාගි වීමත් කීප තැනක පන්සල් විවෘත කිරීමත් පමණයි.

මම ගිය රටවල් ගණන විශාලයි. මහණ වූ පසු ගිය රටවල් පමණක් මෙහි සඳහන් කරන්න කැමැතියි.

ඕලන්දය, බෙල්ජියම, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ස්විට්සර්ලන්තය, ඔස්ට්‍රියාව, චෙක් සමූහාණ්ඩුව, ඩෙන්මාර්කය, ස්වීඩනය, ෆින්ලන්තය, එස්ටෝනියාව, රුසියාව, එක්සත් ජනපදය (හැමතැනම), කැනඩාව (හැමතැනම), බ්‍රසීලය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, බුරුමය, තායිලන්තය, වියට්නාමය, භූටානය, ටිබැටය, චීනය (බොහෝ තැන්), පිලිපීනය, හොංකොං, තායිවානය, කොරියාව, ජපානය, මොංගෝලියාව, ඩුබායි, ඕමානය, කටාර්, දකුණු අප්‍රිකාව හා සිම්බාබ්වේ.



මුදිතා තෙරේසා භික්ෂුණිය පැවිදි කල ද - ජර්මනිය



ජර්මන් ගිහියෙක් පැවිදි කල ද - ජර්මනිය




බර්ලින් බෞද්ධ විහාරය ඉදිරියේ





තේම්ස් බෞද්ධ විහාරයේ වස් සමාදන්ව - 1984



සිංගප්පූරුවේ බ්‍රයිට්හිල් බෞද්ධ විහාරය ඉදිරියේ - 1989



ඕස්ට්‍රේලියාවේ දී ජර්මන්
ඡායාරූප ශිල්පියකු සමඟ



සිංගප්පූරුවේ බ්‍රයිට්හිල් බෞද්ධ විහාරය
ඉදිරියේ අජාන් යන්ත්‍ර හිමි සමඟ

# මගේ ගුරු හාමුදුරුවෝ

‘1975 මැයි මාසේ දවසක සුදු ඇඳුමක් ඇඳපු රූඩී හැමල්බර්ග් (Rudy Hammelburg) කියන තරුණයෙක් මා දකීමට ආවා. ඒ වෙලාවේ මට දැනුණේ පෙර භවයක මගේ පුතෙක් මේ භවයේ ආපසු ඇවිත් කියා. මගේ දෑස තෙත් වුණා. ආදරය නිසා මගේ හදවත උණුවුණා’.

1977 දී මගේ උපසම්පදා උත්සවයට සහභාගි වෙන්න ලංකාවට ආ මගේ මාපියන්ට, මගේ ගුරු හාමුදුරුවෝ - අතිඋතුම් අග්ගමහා පණ්ඩිත දවුල්දෙන ඥාණිස්සර හිමියන් එසේ කීවා.



සාසනයට ජීවිත කාලයම කැපකළ ඉහළම මට්ටමට උගත් පඬිරුවනක් වූ මේ හිමියන්ගේ දීප්තිමත් ජීවිතය දෙස හැරී බලද්දී උන්වහන්සේ කී දේ මට මතක්වෙනවා. 102 වන වර්ෂයේ සිටි උන්වහන්සේ 2017 අප්‍රියෙල් 3 වන දින අපවත් වී වදාළා. ඒ වනවිට, උන්වහන්සේ ලංකාවේ බෞද්ධ නිකායන් තුනෙන් එකක් වූ අමරපුර නිකායේ උත්තරීතර හිමියන් වශයෙන් සිටියා. මෙකී උසස් තනතුර 1950 මුල් කාලයේ ඇතිවූවක්. අමරපුර නිකායේ උප නිකායන් 21 අතර එක්සත්කමක් ඇතිකිරීමට - විශේෂයෙන්ම ජාතික ප්‍රශ්ණයකදී රජය මහා

සංඝයාගේ අදහස් විමසන විට හෝ යම්කිසි විශේෂ කාරණයක් සම්බන්ධයෙන් නිකාය තුන එකඟතාවයකට පැමිණීමට මේ තනතුර තිබීම අවශ්‍ය වුණා.

පාලි හා සංස්කෘත පරතෙරට උගත් පඬිවරුන් අතරින් උගත් පඬිවරයෙකු වශයෙන් මහානායක තෙරුන්වහන්සේ සලකනු ලැබුවා. අවසාන මොහොත දක්වාම හොඳ සිහිකල්පනාවෙන් සිටි උන්වහන්සේට පූර්ණ ධාරණ ශක්තියක් තිබුණා. උන්වහන්සේගේ දැනුම හා උගත්කම නිසා උන්වහන්සේට බොහෝ ගරු නම්බු නාම ලැබුණා.

කඳුකරයේ වැලිමඩ ඌව පරණගම පෙදෙසේ දවුල්දෙන නම් ගමෙන් පැවත ආ උන්වහන්සේ පැවිදි වුණේ වයස අවුරුදු 12 දී. උන්වහන්සේගේ පියා වූ ආලෝක මුදියන්සේලාගේ කව්රාල, මැණියන් වූ ගජනායක මුදියන්සේලාගේ කිරිමැණිකේ දරුවන් දොළොස් දෙනෙකු මෙලොවට දායාද කළා- ඔවුන්ගෙන් තුන්දෙනෙක් බාල වියේදීම මිය ගියා. මහණවීමෙන් පසු උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙනේ ඉගෙනීම ලැබුවා.

1815 දී මහනුවර රාජධානිය ඈඳාගත් පසුව බ්‍රිතාන්‍යයෝ මුළු රටෙහිම පරිපාලනය සිය අතට ගත්තා. එතැන් පටන් නගරයේ බෞද්ධයන්ට අබෞද්ධ බලවේගයන්ගෙන් හිරිහැර එල්ල වන්නට වුණා. මෙකී අවදියේ කොළඹ ඇරඹුණු එකම බෞද්ධ අධ්‍යාපන ආයතනය විද්‍යෝදය පිරිවෙනයි. අබෞද්ධයෝ ක්‍රිස්තියානි ධර්මය පතුරුවන්නන්ට මෙරටට ඇවිත් ඔවුන්ගේ ධර්මය පතුරුවා. ඔවුන්ට ක්‍රිස්තියානි පාසල් ඇරඹීමට ඉඩ දුන්නා.

පැවිදි පක්ෂයට වගේම ගිහියන්ටත් බෞද්ධ විෂයයන් උගන්වන ආයතනයක් පටන් ගන්න කියා කොළඹ බෞද්ධ නායකයන් කීපදෙනෙක් දකුණු ලංකාවේ උගත් පඬිරුවනක් වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ට ආරාධනා කළා. වැඩි තැනක් පැවිදි පක්ෂයට දෙන්නට අදහස් කළ ඒ ආයතනය 1873 දෙසැම්බර් මාසයේදී මරදානේ මාලිගාකන්දේදී සිසුන් සත්දෙනෙකුගෙන් ආරම්භ කළා.

අධ්‍යාපනය නිමකළාට පසසේ දවුල්දෙන ඤාණිස්සර හිමියෝ මහරගම ශ්‍රී වජිරඥාන භික්ෂු පුහුණු ආයතනය, හුනුපිටියේ ගංගාරාමය හා ගම්පොල බුවනෙකබා පිරිවෙනේ ඉගැන්වූවා.

මේ හිමියන්ගේ ධර්ම ඥාණය පිළිගත් උඩරට අමරපුර සාමාග්‍රී සංඝ සභාව උන්වහන්සේ නිකායේ මහානායක ලෙස පත් කළා. අතිගරු මඩිහේ පඤ්ඤාසීහ හිමියන් අපවත් වූ පසු අමරපුර නිකායේ උත්තරීතර සංඝනායක වශයෙන් උන්වහන්සේ පත් කරනු ලැබුවා.

භාෂා කීපයක් ඉතාමත් හොඳින් උගත් නාහිමියෝ පොත් ගණනාවක් ප්‍රකාශයට පත් කළා. බෞද්ධ සම්මේලන හා වැඩමුළුවලට සහභාගිවීමටත් පෞද්ගලික ආරාධනාවලටත් උන්වහන්සේ රටවල් ගණනාවකට ගියා.

බුද්ධාගම වටහාගැනීමට නම් පාලි දැනගත යුතු බව කී උන්වහන්සේ මට පාලි ඉගැන්වීමට උනන්දු වුණා. මම පොතපත් වලින් පාලි ඉගෙන ගත්තා.

බෞද්ධ භික්ෂුවක් හැටියට ජීවත් වීමට මට මග පෙන්වීම ගැනත් මා පළමුව සාමණේර කෙනෙකු වශයෙන් පැවිදි කර පසුව උපසම්පදා තත්වයට යෑමට මගේ මාර්ගය සකස් කිරීමත් ගැන මම උන්වහන්සේට බෙහෙවින් කෘතඥ වෙනවා. මේ අතර මගේ අධ්‍යාත්මික ගුරුවරුන් ලෙස කඳුබොඩ මධ්‍යස්ථානයේ ගරුතර කහටපිටියේ සුමතිපාල නායක තෙරුන් හා ගරුතර කටුකැලේ සීවලී නායක හිමියන් ගෞරවයෙන් සිහිපත් කරනවා. සීවලී හිමියන් තුළ තිබූ මානසික බලයත් කෙනෙකුගේ සිත කියැවීමේ හැකියාවත් යමෙකු තමා දැකීමට එනවිට ඔහු එන්නේ ඇයිදැයි කලින් දැනගැනීමේ හැකියාවත් මගේ සිත් ගත්තා.

ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාවේම වුවත් මා දුර ගමන් ගිහින් ආපසු පැමිණෙද්දී මහානායක හිමියෝ හැමවිටම ආදරයෙන් පිළිගත්තා.

අවසන්...



බුදුසසුන්හි පැහැදුණු
මෛත්‍රී බ්‍රහ්මවිහරණය ඇති
යම් භික්ෂුවක් වේ නම් හේ
සංස්කාරයන් ගේ ව්‍යපසම
සුඛය වූ ශාන්ත නිර්වාණ සුඛය
ලබන්නේය

**භික්ෂු වර්ගය - ධම්මපදය**

